# 2022.08.09 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය.
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
07. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
08 .ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
09. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
10. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
11. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
12. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
17. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
18. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
19. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
29.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
30.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

## <u>රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>

01. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා

04. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
06. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 අගෝස්තු මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

**I.2022.07.12 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.07.12 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය- (එ.ජා.ප.)</u>**

2022.07.12 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022.07.12 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඒ අනුව 2022.07.12 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.07.12 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

## I. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය- (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## II. නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා නව අගමැති දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුභපැතීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා නව අගමැති දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුභපැතීම සඳහා විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා - (එ.ජා.ප.)</u>**

නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා නව අගමැති දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුභපැතීම සඳහා විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා නව අගමැති දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුභපැතීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා

**ඒ අනුව නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා නව අගමැති දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුභපැතීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

ගරු මන්ත්‍රීවරුනි,දැනට පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව පළාත්පාලන ආයතනයක් විදියට විවිධ බාධක මැද මෙම සභාව කරගෙන යනවා. පසුගිය කාල සීමාව තුළ විවිධ දේශපාලන අර්බුදවලට අපි සියලු දෙනාටම මුහුණ දෙන්න සිදු වුණා.නමුත් අපි සභාවක් විදියට මම මේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලුවේ අපේ කාර්යභාරය හරියට ඉටු කරන්න කියලා.ඔබතුමන්ලාගේ කොට්ඨාසවල ජනතාව වෙනුවෙන් සභාවෙන් කළයුතු කටයුතු නොපිරිහෙලා ඉටු කරනවා. අපිට කළ නොහැකි දේවලුත් තිබුණා. මට මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම කතා කළා මාර්ග සංවර්ධන කටයුතු පිළිබඳව. නමුත් ඉන්ධන අර්බුදය නිසා අපිට ඒ කටයුතු ටිකක් අතපසුවුණා. 100%ක් ම නැතිවුණත් ඉන්ධන අර්බුදය යම්තරමකට විසඳෙමින් පවතින නිසා අපි මේ දවස්වල වීදි පහන් අලුත්වැඩියා කිරීම වගේ දේවල් කරමින් යනවා.විශේෂයෙන්ම මම කියනවා වීදිපහන් අලුත් වැඩියා කිරීම සම්බන්ධව මන්ත්‍රීවරුන්ට දීලා තිබෙනවා ඔබගේ කොට්ඨාසයට අදාළ මුළු අවුරුද්දටම සරිලන වැඩසටහන් විස්තරය.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා පෙ.ව.10.23 ට පමණ ගරු සභාවෙන් පිටව ගියා.

එය මුල් අවදියේ හරියට ක්‍රියාත්මක වුණා. පසුව ඉන්ධන අර්බුදය, පවතින දේශපාලන අස්ථාවරත්වය මත ඒවා නිසිලෙස සිදුවී නැති බව පෙනෙනවා. ඒ නිසා ඒ පිළිබඳව සාමාන්‍ය ජනතාවගෙන් මට ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබෙමින් පවතිනවා. ඉතින් අදාළ කොට්ඨාසයේ මන්ත්‍රීවරයාත් දැනුවත් කරන්න කියලා අලුත්වැඩියා කිරීම් කරන්න අදාළ දිනයට සභාවේ සේවක මහතෙක් යවනවා. එනිසා එක කොට්ඨාසයකට ගියාම එම කොට්ඨාසයේ ක්‍රියා විරහිත සියලුම වීදි පහන් අලුත් වැඩියා කරන්න. මොකද එක වීදි පහනක් අලුත්වැඩියා කරන්නත් අපට විශාල කාලයක් ශ්‍රමයක් වැය කරන්න වෙනවා. පක්ෂභේදයකින් තොරව

මෙය කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම සමහර කොට්ඨාසවල එක මන්ත්‍රීවරයෙක් ඉන්න කොට්ඨාසත් තිබෙනවා. සමහර කොට්ඨාසවල මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ඉන්න කොට්ඨාසත් තිබෙනවා.ඒ අය සාකච්ඡා කරලා බෙදාගෙන වීදි පහන් අලුත්වැඩියා කරන්න. ගමේ පවතින ජනතාවගේ අනෙකුත් ප්‍රශ්න,කර්මාන්ත ඉදිකිරීමේදී එන පරිසර ප්‍රශ්න ආදි දේවල් පිළබඳව ඔවුන් දැනුවත් නෑ.එනිසා ගරු මන්ත්‍රීවරු ඒ පිළිබඳව අවධානය යොමු කරලා ස්වේච්ඡා සංවිධාන මඟින් හෝ ජනතාව දැනුවත් කරන්න. ඔබ සියලුදෙනා ගමේ මරණාධාර සමිතියේ සාමාජිකයෝ. එහිදී හෝ දේශපාලන වශයෙන් නෙවෙයි නමුත් පළාත් පාලන ආයතනයක් ලෙස නිරවුල්ව කර්මාන්තයක් ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු කරන ආකාරය ගැන පැහැදිලි කිරීමක් කරලා දෙන්න. මොකද සමහර කර්මාන්ත ආරම්භ කළාට පස්සේ ඒවාට විරෝධතා එනවා. නමුත් කර්මාන්ත හිමියෝ අදාළ ක්‍රියාමාර්ග ගැන දැනුවත් නෑ.ඒ වගේම අනුකූලතා සහතික, වීදිරේඛා සහතික, ආදිය අනිවාර්යෙන්ම ගන්න අවශ්‍යයි.මොකද ඒවා හැදුවට පස්සේ යම් ප්‍රශ්නයක් ආවොත් ඒවාට අවශ්‍ය කරන උපදෙස් අපිට දෙන්න බැරිවෙනවා. ඒවා නීති විරෝධී විදියට ඉදිකළ ගොඩනැගිල්ලක් වුණොත් එය ඉදිකළ පුද්ගලයත් අනෙක් පාර්ශවත් අපහසුතාවට පත්වෙනවා.සෑම ගරු මන්ත්‍රීවරයෙක්ම මහා සභා රැස්වීමට පැමිණෙන්න.එවිට තම කොට්ඨාසයට අදාළ ගැටලු සාකච්ඡා කළ හැකියි. මත ගැටුම්, පක්ෂභේද, ආදිය තිබිය හැකියි.නමුත් අපි කොට්ඨාසය නියෝජනය කරන මහජන නියෝජිතයා විදියට ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටින්න අවශ්‍යයි. ඒ පෙනී සිටින ස්ථානය තමයි සභාව.ඒ නිසා මහා සභා රැස්වීමට එන්න. නොපැමිණීම නිසා සමහර මන්ත්‍රීවරු වැරදි අවබෝධවල ඉන්නවා. මේ පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න.

ගරු සභාපතිතුමා විසින් 2022.07.12 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.

## I. නිවාඩු අනුමත කිරීම.

__ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා__

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

__ගරු උප සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා.__

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

__ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රීලං.පො.ජ.පෙ.)__

එම යෝජනාව මා ස්ථිර කරනවා.

__ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා__

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු

මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## II. මාර්ග නම් කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පිහිඹිය ශ්‍රී බෝධියංගනාරාමය, හංතිහව ශ්‍රී නාගිතාරාමය සහ රත්මලේ ශ්‍රී පූර්වාරාමය යන විහාරාත්‍රයාධිපතිව වැඩසිට අපවත් වී වදාළ ජංකුරාවෙල සිරිනිවාස නාහිමිපාණන් වහන්සේ විදුහල්පතිවරයෙකු, පඬුවස්නුවර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ අංක 01 කලාපයේ ප්‍රධාන ලේඛකාධිකාරී, පහළ දොලොස්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක ධූරයද හොබවමින් රටට,දැයට සමයට අතිමහත් සේවාවක් සිදු කළ මහා යතිවරයාණන් කෙනෙකි. උන්වහන්සේට උපහාරයක් වශයෙන් උන්වහන්සේ වැඩ සිටි පිහිඹිය ශ්‍රී බෝධියංගනාරාම විහාර භූමිය අසලින් ඇති පිහිඹිය පන්සල පාර බරම්පොල සිට හමන්නාපහුව දක්වා වූ මාර්ගයේ ඉහළ පිහිඹිය හංදිය දක්වා කොටස උන්වහන්සේගේ නමින් “ශ්‍රී සිරිනිවාස නාහිමි මාවත” යනුවෙන් නම් කිරීම සුදුසු බවට 2022.06.05දින විහාරස්ථ දායක සමිතිය ඒකමතිකව යෝජනා සම්මත කරගෙන ඇත. කිලෝමීටරයක පමණ එම මාර්ගය “ශ්‍රී සිරිනිවාස නාහිමි මාවත” යනුවෙන් නම් කිරීමට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය කඩිනමින් ලබාදෙන ලෙස මෙයින් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ. විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>

මමත් ඇතුළුව තවත් මන්ත්‍රීවරු දෙපළක් නියෝජනය කරන කොට්ඨාශයේ මාර්ගයක් තමයි මේ මාර්ගය.ඇත්තටම මෙම ස්වාමින් වහන්සේ එම ප්‍රදේශයට වගේම ආසනයට විශාල සේවයක් කළ යතිවරයාණන් වහන්සේ නමක්. මූලිකවම මගුලාගම මධ්‍ය විද්‍යාලය වත්මන් තත්වයට ගේන්න වසර ගණනාවකම මහත් පරිශ්‍රමයක් දරලා සංවර්ධනය කළා. ඒ වගේම හන්තිහව කනිෂ්ට විද්‍යාලයේ විදුහල්පතිවරයෙකු ලෙස උන්වහන්සේ සේවය කළා. ඒ වගේම පිහිඹිය රත්මලේ තිබෙන විහාර තුනේම විහාරාධිපතිව අපේ කෝරළයේ විශේෂයෙන්ම පඬුවස්නුවර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරී ස්වාමින්වහන්සේ විදියට හිටියා. අවසානයේදී උන්වහන්සේ අපවත්වෙද්දී ප්‍රධාන අධිකරණ සංඝනායක ලෙස තමා සේවයේ යෙදුනේ.ඒ වගේම පන්සල් වත්ත පන්සල සතු කර ගන්න උන්වහන්සේගේ වැටුපෙන් නඩු කීවා.වසර ගණනාවකට පස්සේ පන්සල් භූමිය උන්වහන්සේ සතුකර ගත්තා. මෙම මාර්ගය කැට අල්ලා සංවර්ධනය කර ගැනීමටත් උන්වහන්සේට විශාල අවශ්‍යතාවයක් තිබුණා.ඉතින් මෙම යෝජනාව දායක සමිතිය විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. එම මාර්ගය “ශ්‍රී සිරිනිවාස නාහිමි මාවත” යනුවෙන් නම් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

පිහිඹිය ශ්‍රී බෝධියංගනාරාම විහාර භූමිය අසලින් ඇති පන්සල පාර බරම්පොල සිට හමන්නාපහුව දක්වා වූ මාර්ගයේ ඉහළ පිහිඹිය හංදිය දක්වා කොටස උන්වහන්සේගේ නමින් ශ්‍රී සිරිනිවාස නාහිමි මාවත යනුවෙන් නම් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පිහිඹිය ශ්‍රී බෝධියංගනාරාම විහාර භූමිය අසලින් ඇති පන්සල පාර බරම්පොල සිට හමන්නාපහුව දක්වා වූ මාර්ගයේ ඉහළ පිහිඹිය හංදිය දක්වා කොටස උන්වහන්සේගේ නමින් ශ්‍රී සිරිනිවාස නාහිමි මාවත යනුවෙන් නම් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## III.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18(2) වගන්තිය යටතේ විගණන ගාස්තු තීරණය කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18(2) වගන්තිය යටතේ විගණන ගාස්තු තීරණය කිරීම සම්බන්ධයෙන් වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NWP/CM/AC08/42 හා 2022.06.29 දිනැති ලිපිය හා බැඳුනු, 2020 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු පිළිබඳ දන්වා ඇති අතර ඒ සඳහා එකඟතාවන් හා නිර්දේශ විමසා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.165600.00ක මුදලක් සඳහන් කර තිබෙනවා. එම කාරණය සඳහා සභා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>**

2020 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.165600.00ක මුදල ගෙවීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2020 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.165600.00ක මුදල ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2020 වර්ෂයට අදාලව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.165600.00ක මුදල ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## IV.බස්නැවතුම්පොල රථගාල සම්බන්ධයෙන්.

ඒ.එච්.එම්. සරත් පියරත්න, ආදායම් පරීක්ෂක, පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් 2022.08.04 දාතමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.එමඟින් පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් බස්නැවතුම්පොල රථගාල 2022 වර්ෂයට බදු ලබාගත් බදුකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව බස්නැවතුම්පොල රථගාල පරීක්ෂා කිරීම 2022.07.18,21,25 යන දිනයන්හිදී සිදු කළ බවත් එහිදී ඉන්ධන අර්බුදය හේතුවෙන් දිනකට සීමිත බස් ප්‍රමාණයක් පමණක් ධාවනය වන බව නිරීක්ෂණය වූ බවත් පාසල් නොපැවැත්වීම හා රාජ්‍ය

ආයතන සඳහා පැමිණෙන නිලධාරීන් සීමා කිරීම වැනි හේතූන් මත මඟීන්ගේ පැමිණීමේ අඩුවක්ද පැවති බව දන්වා තිබෙනවා.එමෙන්ම 2022 මැයි මස සිට රථගාලෙහි ආදායම අඩුවී ඇති බැවින් වාරික මුදල් ගෙවීම සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා තිබෙනවා.එම කාලය තුළද රටේ පැවති කලබලකාරී වාතාවරණය, අරගල, උද්ඝෝෂණ හා පොලිස් ඇඳිරිනීතිය පැනවීම වැනි තත්වයන් හේතුකොටගෙන පොදු ප්‍රවාහනය සීමිත වීම මත දැනට පවතින තත්වයම පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකියි. ඒ අනුව බදුකරු විසින් මාසිකව ගෙවිය යුතු වාරික මුදල එකතු කර ගැනීමේ අපහසුතාවය පිළිබඳව ඉදිරිපත් කර ඇති ලිපියේ කරුණු නිවැරදි බව පැහැදිලි වේ. එකී කරුණ තවදුරටත් සනාථ කර ගැනීම සඳහා රථගාලෙහි වාරික සහන ඉල්ලා ඇති මාසවල දෛනික ආදායම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පහත පරිදි වේ.

| මාසය | මාසික ආදායම |
|---|---|
| මැයි | 39200.00 |
| ජූනි | 36470.00 |
| ජූලි | 27930.00 |

ඉහත තොරතුරු අනුව බදුකරුට මාසික වාරික මුදල අය කර ගැනීමට පවතින තත්වය තුළ හැකියාවක් නොමැති බව පැහැදිලි බැවින් බදුකරුට වාරික මුදල් ගෙවීමේදී සහනයක් ලබා දීම සුදුසු බව ආදායම් පරීක්ෂකතුමා නිර්දේශ කර තිබෙනවා.

- මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.39200.00 ක මුදලක් අය කිරීමත්, රු.15050.00 ක මුදල කපාහැරීමත්
- ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.36470.00ක මුදලක් අය කිරීමත්, රු.17780.00 ක මුදල කපාහැරීමත්
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.27930.00ක මුදලක් අය කිරීමත්, රු.26320.00 ක මුදල කපාහැරීමත්,බදුකරු විසින් මැයි, ජූනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත්

සුදුසු බවට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි,බස්නැවතුම්පොල රථගාල බදුකරු විසින් ඉන්ධන අර්බුදය හේතුවෙන් දිනකට සීමිත බස් ප්‍රමාණයක් පමණක් ධාවනය වීමත් පාසල් නොපැවැත්වීම හා රාජ්‍ය ආයතන සඳහා පැමිණෙන නිලධාරීන් සීමා කිරීම වැනි හේතූන් මත මඟීන්ගේ පැමිණීමේ අඩුවීම හේතුවෙන් 2022 මැයි,ජූනි,ජූලි මාස සඳහා වාරික සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බස්නැවතුම්පොල රථගාල සඳහා

- මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.39200.00 ක මුදලක් අය කිරීමත්, රු.15050.00 ක මුදල කපාහැරීමත්
- ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.36470.00ක මුදලක් අය කිරීමත්, රු.17780.00 ක මුදල කපාහැරීමත්
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.27930.00ක මුදලක් අය කිරීමත්, රු.26320.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>**

බස්නැවතුම්පොල රථගාල බදුකරු විසින් ඉන්ධන අර්බුදය හේතුවෙන් දිනකට සීමිත බස් ප්‍රමාණයක් පමණක් ධාවනය වීමත් පාසල් නොපැවැත්වීම හා රාජ්‍ය ආයතන සඳහා පැමිණෙන නිලධාරීන් සීමා කිරීම වැනි හේතූන් මත මඟීන්ගේ පැමිණීමේ අඩුවීම හේතුවෙන් 2022 මැයි,ජූනි,ජූලි මාස සඳහා වාරික සහනයක්

ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බස්නැවතුම්පොල රථගාල සඳහා

- මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.39200.00 ක මුදලක් අය කිරීමත්, රු.15050.00 ක මුදල කපාහැරීමත්
- ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.36470.00ක මුදලක් අය කිරීමත්, රු.17780.00 ක මුදල කපාහැරීමත්
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.27930.00ක මුදලක් අය කිරීමත්, රු.26320.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් මැයි, ජූනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

බස්නැවතුම්පොල රථගාල බදුකරු විසින් ඉන්ධන අර්බුදය හේතුවෙන් දිනකට සීමිත බස් ප්‍රමාණයක් පමණක් ධාවනය වීමත් පාසල් නොපැවැත්වීම හා රාජ්‍ය ආයතන සඳහා පැමිණෙන නිලධාරීන් සීමා කිරීම වැනි හේතූන් මත මගීන්ගේ පැමිණීමේ අඩුවීම හේතුවෙන් 2022 මැයි,ජූනි,ජූලි මාස සඳහා වාරික සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බස්නැවතුම්පොල රථගාල සඳහා

- මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.39200.00 ක මුදලක් අය කිරීමත්, රු.15050.00 ක මුදල කපාහැරීමත්
- ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.36470.00ක මුදලක් අය කිරීමත්, රු.17780.00 ක මුදල කපාහැරීමත්
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.27930.00ක මුදලක් අය කිරීමත්, රු.26320.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් මැයි, ජූනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව බස්නැවතුම්පොල රථගාල බදුකරු විසින් ඉන්ධන අර්බුදය හේතුවෙන් දිනකට සීමිත බස් ප්‍රමාණයක් පමණක් ධාවනය වීමත් පාසල් නොපැවැත්වීම හා රාජ්‍ය ආයතන සඳහා පැමිණෙන නිලධාරීන් සීමා කිරීම වැනි හේතූන් මත මගීන්ගේ පැමිණීමේ අඩුවීම හේතුවෙන් 2022 මැයි,ජූනි,ජූලි මාස සඳහා වාරික සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බස්නැවතුම්පොල රථගාල සඳහා**

- **මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.39200.00 ක මුදලක් අය කිරීමත්, රු.15050.00 ක මුදල කපාහැරීමත්**
- **ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.36470.00ක මුදලක් අය කිරීමත්, රු.17780.00 ක මුදල කපාහැරීමත්**
- **ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.54250.00 ක මුදලෙන් රු.27930.00ක මුදලක් අය කිරීමත්, රු.26320.00 ක මුදල කපාහැරීමත්**

**විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් මැයි, ජූනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## V.බණ්ඩාරකොස්වත්ත සතිපොල සම්බන්ධයෙනි.

ඒ.එච්.එම්. සරත් පියරත්න, ආදායම් පරීක්ෂක, පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් 2022.08.04 දාතමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.එමගින් පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් බණ්ඩාරකොස්වත්ත සතිපොල බදු ලබාගත් බදුකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව බණ්ඩාරකොස්වත්ත සතිපොල පරීක්ෂා කිරීම 2022.07.26 යන දිනයන්හිදී සිදු කළ බවත් එහිදී කඩ කාමර වැඩි ප්‍රමාණයක් හිස්ව තිබීමත් වෙළෙඳුන්ගේ හා පාරිභෝගිකයන්ගේ පැමිණීමේ අඩුවක්ද පැවති බව නිරීක්ෂණය වී ඇත. බදුකරු විසින් මාසිකව ගෙවිය යුතු වාරික මුදල එකතු කර ගැනීමේ අපහසුතාවය පිළිබඳව ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් කරුණු ,නිරීක්ෂණය කල දින පැවති තත්වය හා සසඳා බලන විට නිවැරදි බව නිර්දේශ කලහැකි බවත් එම කරුණ තවදුරටත් සනාථ කර ගැනීමට බදුකරු විසින් සහන ඉල්ලා සිටින ජුනි,ජූලි මස සතිපොල පැවති දිනවල ලැබී ඇති ආදායම පිළිබඳව තොරතුරු ලබාගත් බවත් දන්වා තිබෙනවා. ඒ අනුව ජුනි හා ජූලි මාසවල ලැබී ඇති ආදායම පහත පරිදි වේ.

| මාසය | දිනය | මාසික ආදායම |
|---|---|---|
| ජුනි | 2022.06.07 | 12500.00 |
| | 2022.06.14 | 0 |
| | 2022.06.21 | 11980.00 |
| | 2022.06.26 | 12150.00 |
| | එකතුව | 36630.00 |

| මාසය | දිනය | මාසික ආදායම |
|---|---|---|
| ජූලි | 2022.07.05 | 9760.00 |
| | 2022.07.12 | 12450.00 |
| | 2022.07.19 | 11790.00 |
| | 2022.07.26 | 13050.00 |
| | එකතුව | 47050.00 |

එම තොරතුරුවලට අනුව බදුකරුට මාසික වාරික මුදල අයකරගැනීමට පවතින තත්වය තුළ හැකියාවක් නොමැති බැවින් වාරික සහනයක් ලබා දීම සුදුසු බව ආදායම් පරීක්ෂකතුමා නිර්දේශ කරන අතර

- ජුනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.36630.00 ක මුදලක් අය කිරීමත්, රු.25878.00 ක මුදල කපාහැරීමත් හා
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.47050.00ක මුදලක් අය කිරීමත්, රු.15458.00 ක මුදල කපාහැරීමත්,බදුකරු විසින් ජුනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත්

සුදුසු බවට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි,බණ්ඩාරකොස්වත්ත සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් බණ්ඩාරකොස්වත්ත සතිපොලේ බදුකරු විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බණ්ඩාරකොස්වත්ත සතිපොල සඳහා

- ජුනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.36630.00 ක මුදලක් අය කිරීමත්, රු.25878.00 ක මුදල කපාහැරීමත් හා

- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.47050.00ක මුදලක් අය කිරීමත්, රු.15458.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් ජූනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

බණ්ඩාරකොස්වත්ත සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් බණ්ඩාරකොස්වත්ත සතිපොලේ බදුකරු විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බණ්ඩාරකොස්වත්ත සතිපොල සඳහා

- ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.36630.00 ක මුදලක් අය කිරීමත්, රු.25878.00 ක මුදල කපාහැරීමත් හා
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.47050.00ක මුදලක් අය කිරීමත්, රු.15458.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් ජූනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

බණ්ඩාරකොස්වත්ත සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් බණ්ඩාරකොස්වත්ත සතිපොලේ බදුකරු විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බණ්ඩාරකොස්වත්ත සතිපොල සඳහා

- ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.36630.00 ක මුදලක් අය කිරීමත්, රු.25878.00 ක මුදල කපාහැරීමත් හා
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.47050.00ක මුදලක් අය කිරීමත්, රු.15458.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් ජූනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව බණ්ඩාරකොස්වත්ත සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් බණ්ඩාරකොස්වත්ත සතිපොලේ බදුකරු විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, බණ්ඩාරකොස්වත්ත සතිපොල සඳහා**

- **ජූනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.36630.00 ක මුදලක් අය කිරීමත්, රු.25878.00 ක මුදල කපාහැරීමත් හා**
- **ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.62508.00 ක මුදලෙන් රු.47050.00ක මුදලක් අය කිරීමත්, රු.15458.00 ක මුදල කපාහැරීමත්**

**විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් ජුනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## VI.විජය උදාගම සතිපොල සම්බන්ධයෙනි.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

අයි.එම්.එස්.මධුභාෂිණි,ආදායම් පරීක්ෂක,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් 2022.08.08 දාතමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එමඟින් විජය උදාගම සතිපොල බදුකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සතිපොල පැවැත්වූ 2022.08.07 දින සතිපොල පරීක්ෂා කිරීම සිදු කර තිබෙන අතර එහිදී වෙළෙඳුන්ගේ පැමිණීම අඩු මට්ටමක තිබූ බවත් කඩ කාමර වැඩි ප්‍රමාණයක් හිස්ව තිබූ බවත් පාරිභෝගිකයන්ගේ පැමිණීමද අඩුවක්ව පැවති බවත් දන්වා තිබෙනවා.එම නිසා වාරික මුදල් ගෙවීමට ලැබුණු ආදායම ප්‍රමාණවත් නොවූ බව සනාථ වූ බවත් එම නිසා 2022 මැයි, ජුනි,ජූලි මාස සඳහා ටෙන්ඩර් වාරික සහනයක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබෙනවා. ඒ අනුව මැයි, ජුනි හා ජූලි මාසවල ලැබී ඇති ආදායම පහත පරිදි වේ.

| මාසය | දිනය | සතිපොල පැවති දින ආදායම |
|---|---|---|
| මැයි | 2022.05.01 | 3700.00 |
| | 2022.05.08 | 6900.00 |
| | 2022.05.15 | වෙසක් පොහොය |
| | 2022.05.22 | 5800.00 |
| | 2022.05.29 | 7600.00 |
| මාසය තුළ ලද මුළු ලැබීම් | | 24000.00 |
| සේවක කුලිය | | 8000.00 |
| **මාසය තුළ ලද ආදායම** | | **<u>16000.00</u>** |

| මාසය | දිනය | සතිපොල පැවති දින ආදායම |
|---|---|---|
| ජුනි | 2022.06.05 | 8300.00 |
| | 2022.06.12 | 8700.00 |
| | 2022.06.19 | 7900.00 |
| | 2022.06.26 | 8100.00 |
| මාසය තුළ ලද මුළු ලැබීම් | | 33000.00 |
| සේවක කුලිය | | 8000.00 |
| **මාසය තුළ ලද ආදායම** | | **<u>25000.00</u>** |

| මාසය | දිනය | සතිපොල පැවති දින ආදායම |
|---|---|---|
| ජූලි | 2022.07.03 | 8400.00 |
| | 2022.07.10 | 5600.00 |
| | 2022.07.17 | 8850.00 |

| | | |
|---|---|---|
| | 2022.07.24 | 8200.00 |
| | 2022.07.31 | 8700.00 |
| මාසය තුළ ලද මුළු ලැබීම් | | 39750.00 |
| සේවක කුලිය | | 8000.00 |
| **මාසය තුළ ලද ආදායම** | | **31750.00** |

එම තොරතුරුවලට අනුව බදුකරුට මාසික වාරික මුදල අයකරගැනීමට පවතින තත්වය තුළ හැකියාවක් නොමැති බැවින් වාරික සහනයක් ලබා දීම සුදුසු බව ආදායම් පරීක්ෂකතුමිය නිර්දේශ කරන අතර

- 2022 මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.16,000.00 ක මුදලක් අය කිරීමත්, රු.22,091.00 ක මුදල කපාහැරීමත්,
- ජුනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.25,000.00 ක මුදලක් අය කිරීමත්, රු.13,091.00 ක මුදල කපාහැරීමත් හා
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.31,750.00ක මුදලක් අය කිරීමත්, රු.63,41.00 ක මුදල කපාහැරීමත්,බදුකරු විසින් මැයි, ජුනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත්

සුදුසු බවට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා

<u>**ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (පො.ජ.පෙ.)**</u>

විජය උදාගම සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් විජය උදාගම සතිපොලේ බදුකරු විසින් 2022.08.01 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, විජය උදාගම සතිපොල සඳහා

- 2022 මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.16,000.00 ක මුදලක් අය කිරීමත්, රු.22,091.00 ක මුදල කපාහැරීමත්,
- ජුනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.25,000.00 ක මුදලක් අය කිරීමත්, රු.13,091.00 ක මුදල කපාහැරීමත් හා
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.31,750.00ක මුදලක් අය කිරීමත්, රු.63,41.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**</u>

විජය උදාගම සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් විජය උදාගම සතිපොලේ බදුකරු විසින් 2022.08.01 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, විජය උදාගම සතිපොල සඳහා

- 2022 මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.16,000.00 ක මුදලක් අය කිරීමත්, රු.22,091.00 ක මුදල කපාහැරීමත්,
- ජුනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.25,000.00 ක මුදලක් අය කිරීමත්, රු.13,091.00 ක මුදල කපාහැරීමත් හා

- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.31,750.00ක මුදලක් අය කිරීමත්, රු.63,41.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් මැයි, ජුනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

විජය උදාගම සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් විජය උදාගම සතිපොලේ බදුකරු විසින් 2022.08.01 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, විජය උදාගම සතිපොල සඳහා

- 2022 මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.16,000.00 ක මුදලක් අය කිරීමත්, රු.22,091.00 ක මුදල කපාහැරීමත්,
- ජුනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.25,000.00 ක මුදලක් අය කිරීමත්, රු.13,091.00 ක මුදල කපාහැරීමත් හා
- ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.31,750.00ක මුදලක් අය කිරීමත්, රු.63,41.00 ක මුදල කපාහැරීමත්

විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් මැයි, ජුනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව විජය උදාගම සතිපොල වැනි ග්‍රාමීය පොලවල් සඳහා වෙළඳුන් නොපැමිණීම සහ පාරිභෝගිකයන්ගේ නොපැමිණීම හේතුවෙන් ටෙන්ඩර් වාරිකය සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් විජය උදාගම සතිපොලේ බදුකරු විසින් 2022.08.01 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත් සලකා බලා, විජය උදාගම සතිපොල සඳහා**

- **2022 මැයි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.16,000.00 ක මුදලක් අය කිරීමත්, රු.22,091.00 ක මුදල කපාහැරීමත්,**
- **ජුනි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.25,000.00 ක මුදලක් අය කිරීමත්, රු.13,091.00 ක මුදල කපාහැරීමත් හා**
- **ජූලි මාසයට අදාලව ඔහු විසින් සභාවට ගෙවිය යුතු වාරික මුදල වන (මාස 12න් බෙදූ විට) රු.38091.00 ක මුදලෙන් රු.31,750.00ක මුදලක් අය කිරීමත්, රු.63,41.00 ක මුදල කපාහැරීමත්**

**විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමත්,බදුකරු විසින් මැයි, ජුනි, ජූලි මාසවලට අදාළව ගෙවිය යුතු වාරික මුදල අධි ගාස්තු අය කිරීමකින් තොරව අය කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## VII.කඩ කාමර අයිතිය පැවරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල නව වෙළඳ සංකීර්ණයේ අංක F-03 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි කෙවිටිය, හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී.සිරිල් සමරවීර අයගේ දියණිය වන කෙවිටිය,

හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී. සාගරිකා කුමාරි සමරසිංහ යන අය වෙත,කඩ කාමර අයිතිය පවරා දෙන මෙන් එම්.එම්.ඩී. සාගරිකා කුමාරි සමරසිංහ අය විසින් ලිපියක් අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව චක්‍රලේඛන ප්‍රකාරව එම්.එම්.ඩී. සාගරිකා කුමාරි සමරසිංහ යන අය වෙත F-03 දරණ කඩ කාමරයේ අයිතිය පවරාදීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල නව වෙළඳ සංකීර්ණයේ අංක F-03 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි කෙවිටිය, හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී.සිරිල් සමරවීර අයගේ දියණිය වන කෙවිටිය, හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී. සාගරිකා කුමාරි සමරසිංහ යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව F-03 දරණ කඩ කාමරයේ අයිතිය පවරාදීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල නව වෙළඳ සංකීර්ණයේ අංක F-03 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි කෙවිටිය, හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී.සිරිල් සමරවීර අයගේ දියණිය වන කෙවිටිය, හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී. සාගරිකා කුමාරි සමරසිංහ යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව F-03 දරණ කඩ කාමරයේ අයිතිය පවරාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුවපඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල නව වෙළඳ සංකීර්ණයේ අංක F-03 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි කෙවිටිය, හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී.සිරිල් සමරවීර අයගේ දියණිය වන කෙවිටිය, හල්මිල්ලවැව පදිංචි එම්.එම්.ඩී. සාගරිකා කුමාරි සමරසිංහ යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව F-03 දරණ කඩ කාමරයේ අයිතිය පවරාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## VIII.මාර්ග ගැසට් කිරීමේ දී විරෝධතා කාලය දීර්ඝ කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ එම උපලේඛනයේ දැක්වූ පාරවල් සහ පටු මාවත් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මාවත් ලෙස සැලකිය යුතු බව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට 2022.06.15දින පැවති මහා සභා රැස්වීමේදී යෝජනා කරන ලදි.එහිදී මාර්ග ගැසට් කිරීමේදී විරෝධතා කැඳවීමේ කාලය මාසයක් ලෙස දක්වා තිබුණත් ,ගැසට් පත්‍රය නිකුත් වීමේ ප්‍රමාදය නිසා එම කාලය මාස 03ක කාලයක් ලෙස දීර්ඝ කිරීම සුදුසු බවට යෝජනා ස්ථිර කරන ලෙස ගරු සභාවට දන්වනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා.</u>

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම

පිළිබඳ නියෝග"  මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ  එම උපලේඛනයේ දැක්වූ  පාරවල් සහ පටු මාවත් පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල්  සහ පටු මාවත් ලෙස සැලකිය යුතු බව පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවට 2022.06.15දින පැවති මහා සභා රැස්වීමේදී යෝජනා කරන ලදි.එහිදී මාර්ග ගැසට් කිරීමේදී විරෝධතා කැඳවීමේ කාලය මාසයක් ලෙස දක්වා තිබුණත් ,ගැසට් පත්‍රය නිකුත් වීමේ ප්‍රමාදය නිසා එම කාලය මාස 03ක කාලයක් ලෙස  දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි  මහතා - (එ.ජ.නි.ස.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති  බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ  ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග"  මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ  එම උපලේඛනයේ දැක්වූ  පාරවල් සහ පටු මාවත් පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල්  සහ පටු මාවත් ලෙස සැලකිය යුතු බව පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවට 2022.06.15දින පැවති මහා සභා රැස්වීමේදී යෝජනා කරන ලදි.එහිදී මාර්ග ගැසට් කිරීමේදී විරෝධතා කැඳවීමේ කාලය මාසයක් ලෙස දක්වා තිබුණත් ,ගැසට් පත්‍රය නිකුත් වීමේ ප්‍රමාදය නිසා එම කාලය මාස 03ක කාලයක් ලෙස  දීර්ඝ කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහ සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ  ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග"  මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ  එම උපලේඛනයේ දැක්වූ  පාරවල් සහ පටු මාවත් පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල්  සහ පටු මාවත් ලෙස සැලකිය යුතු බව පඹුවස්නුවර  ප්‍රාදේශීය සභාවට  2022.06.15දින පැවති මහා සභා රැස්වීමේදී යෝජනා කරන ලදි.එහිදී මාර්ග ගැසට් කිරීමේදී විරෝධතා කැඳවීමේ කාලය මාසයක් ලෙස දක්වා තිබුණත් ,ගැසට් පත්‍රය නිකුත් වීමේ ප්‍රමාදය නිසා එම කාලය මාස 03ක කාලයක් ලෙස  දීර්ඝ කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ  ඒකමතිකව සහ සම්මත විය.**

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා

## I. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම.

<u>ගරු සභාපති  බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව  විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය  සභා  ගරු  මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, මේ වනවිට දැවැන්ත ඉන්ධන අර්බුදයකට මුහුණ දීලා තියෙනවා.ඒත් සමඟ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව ඉතාම අපහසුතාවයකට පත් වෙලා තියෙන්නේ.ඒ වගේම වසර තුනකට ආසන්න කාලයක් පාසල් සක්‍රීයව ක්‍රියාත්මක වෙන්නේ නෑ.මේ හේතු කාරණා සියල්ල කැටිකොට ගත්තාම හෙට්ටිපොල සිට මැදගම හරහා ධාවනය වූ බස්රථයත් හෙට්ටිපොල සිට හුණුගම හරහා  කටුපොතට

ධාවනය වු බස්රථයත් වසර කිහිපයක සිට ගමනාගමනය නතරවෙලා තිබෙනවා. මේ බස්රථ දෙක විශාල සේවයක් කළා මේ ප්‍රදේශයේ මඟී ජනතාවට. විශේෂයෙන්ම පාසල් සිසුන්ට. මෙම බස්රථයේ ධාවන කටයුතු නැවතුනාට පසුව පුද්ගලිකව පා පැදියෙන් හෝ යතුරු පැදියෙන් තමා ඒ කටයුතු කරගන්නේ. රියදුරු විදේශගත වීම හා පවතින ඉන්ධන අර්බුදය නිසා හුණුගම හරහා ධාවනය වූ බස්රථය නැවතිලා ගොඩක් කල්. නමුත් කොස්දෙණිය හරහා ධාවනය වු බස් රථය එම රියදුරු මහතාගේ තිබෙන කැපවීම මත විශාල කාලයක් ධාවනය වුණා. නමුත් එතුමා විශ්‍රාම යාමත් සමඟ ඒ බස්රථය ධාවනය වීමත් නැවතුණා.ඉතින් අපිත් පාසල් ගියේ ආවේ ඒ බස්රථවල. ඒ නිසා නැවත එම බස්රථ දෙක ධාවනය කරන්න කියලා කුලියාපිටිය හා වාරියපොල ඩිපෝ අධිකාරීවරුන්ගෙන් ඉල්ලීමක් කරමු. පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය- (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ කාලෝචිත යෝජනාවක්.ඇත්තටම එම බස්රථය රියදුරු මහතාගේ කැපවීමෙන් නොකඩවාම ධාවනය කෙරුණා.නමුත් දැන් මෙම බස්රථය නැති නිසා ජනතාව විශාල අපහසුතාවයකට පත්වෙලා තියෙනවා.මම ඒ නිසා මෙම ගරු සභාවට මතක් කරනවා ඒ බස් රථ දෙක නැවත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා. එය අපේ ප්‍රාදේශීය සභාවටත් ගෞරවයක්.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා -(එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමනි, මේ වනවිට සියලුදෙනාගේම ප්‍රවාහන කටයුතු අඩාලවෙලා තිබෙන්නේ. ඉන්ධන අර්බුදය නිසා ඒ තත්වය තවත් සීමාවෙලා තියෙනවා. ඒ නිසා මේ හැමෝගෙම එකම ගමන් සඟයා වන්නේ බස්රථය.මේ කියන බස් රථවලට දීර්ඝ ඉතිහාසයක් තියෙනවා. ඇත්තටම මේ බස් රථ දෙක ගැන ඩිපෝ කළමණාකරුවන් හා ප්‍රවාහන ඇමතිවරයා දැනුවත් කිරීම සුදුසුයි. මොකද අපි කථා කළොත් කියන්නේ අතුරු මාර්ගවල සෙනඟ අඩුයි. රියදුරු සේවක පිරිස අඩුයි කියලා.ලංගම බස්රථ තමයි වැඩි ප්‍රමාණයක් මෙම පොදු මාර්ගවල ගමන් කරන්නේ.අතුරු මාර්ගයේ මේ බස්රථ ධාවනය වුණා. මේ වනවිට මේ මාර්ග පද්ධතිය සංවර්ධනය කරලා තියෙන්නේ. ඒ නිසා ප්‍රවාහන බලධාරීන්ට කියන්න බෑ පාරවල් කැඩිලා කියලා.නමුත් ඒ බස් රථය හැමෝම බලාපොරුත්තු වුණා. ඒ මාර්ගවල කිලෝ මීටර් 8-10ක් තියෙන කෙනෙකුට අද ත්‍රීරෝද රථයකට ලොකු ගානක් ගෙවන්න වෙනවා.මේ තිබෙන අපහසුතා මැද ජනතාවට මෙම බස්රථ දෙකේ දැඩි අවශ්‍යතාවයක් තිබෙනවා.ඒ නිසා ඩිපෝ අධිකාරීවරුන් හා ප්‍රවාහන බලධාරීන් දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඇත්තටම හොඳ යෝජනාවක්. විශාල ජන ප්‍රමාණයක් ඉන්න ප්‍රදේශයක් නියෝජනය කරන මාර්ග දෙකක්.විශේෂත්වය තමයි මේ පැත්තෙන් හලාවත කුරුණෑගල ප්‍රධාන පාරටත් මූණමල්දෙනිය, කටුපොත, කුරුණෑගල, කොළඹ පාරට සම්බන්ධවන පාරක්. මේ පාරවල් දෙක අත්‍යවශ්‍ය පාරවල් දෙකක්.හුණුගම හරහා හෙට්ටිපොලට බස් රථය දැම්මේ සිරිමාවෝ මැතිණියගේ කාලේ 78 ට පෙර.පඬුවස්නුවර හිටියා පළාත් පාලන ඇමතිවරයෙකු එල්.බී.ජයසේන මැතිතුමා.එතුමා තමයි මේ බස් ගමනාගමනය විවෘත කළේ.ඒ කාලේ මම බොහොම පුංචියි.වසර 45කට විතර පෙර ආරම්භ කළ බස්රියක් තමයි හුණුගම පාරේ බසය.පසුගිය කාලේ මේ බස්රිය ධාවනය සම්පූර්ණයෙන් නවතිනවා.අනිත් බස්රියත් එහෙමයි.එහි රියදුරු උනන්දුවෙන් වැඩ කළා. ඒ කාලේ පාරත් බොහෝම අබලන් වෙලා තිබුණේ.දැන් මෙම බස් රිය දෙක ධාවනයට කිසි අපහසුතාවයක් නෑ. පාරවල් සංවර්ධනය කරලා තියෙන්නේ.හොඳ ආදායමක් ලබා ගන්නත් පුළුවන්. අපි මේ පිළිබඳව ප්‍රවාහන බලධාරීන්ට දන්වමු.පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ධාවන කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධව විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II.ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රාමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පැතීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා - (එ.ජා.ප.)**

ගරු සභාපතිතුමනි, ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා. ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රාමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පැතීමට අවස්ථාව ලබාදීම ගැන සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. රටේ 8වැනි ජනාධිපතිවරයා ලෙස අසීරු අවස්ථාවක තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට භාරගන්නේ. මෙවන් අසීරු අවස්ථාවක රට බාර ගත් එතුමන්ලාට ජනතාවගේ ගැටලු විසඳීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම එතුමන්ලාට දේව ආශිර්වාදය ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම ගරු ජනාධිපති ලෙස රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් කළ සියලුම මන්ත්‍රීවරුන්ට ස්තූතිය පුදකර සිටිනවා. සුදුස්සාට සුදුසු තැන ලබාදීම සම්බන්ධයෙන් අවුරුදු 45ක පාර්ලිමේන්තු පලපුරුද්දක් මත ජනාධිපතිවරයෙකු ලෙස පත් වීමට සුදුසුම පුද්ගලයා තමා එතුමා. ගෑස්, ඉන්ධන ප්‍රශ්න විසඳෙමින් පවතිනවා. පෝලිම් අඩුවෙමින් පවතිනවා. ඇත්තටම තිබුණු අර්බුදකාරී තත්වය ටිකෙන් ටික අඩුවෙලා සහනදායි තත්වයක් ගොඩනැගෙමින් තිබෙන්නේ. අපි සියලු දෙනාම එකතුවෙලා සර්වපාක්ෂික ආණ්ඩුවක් ගොඩ නගමු.මිනිසුන්ගේ දුක්ගිනි නිවමු.අපි සියලු දෙනාම එකතුවෙලා මුලින්ම රට ගොඩනගමු.පසුව දේශපාලනය කරමු. ඒ වගේම ගරු ජනාධිපතිතුමා අගමැතිධුරයේ දිවුරුම් දෙන විටත් මම ඉල්ලා සිටියා මෙම ගරු සභාවේදීම කතෝලික මන්ත්‍රීවරයෙක් විදියට පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කතෝලික ජනතාවට සාධාරණයක් ඉටු කරන ලෙස. මම අදත් ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අහිංසක කතෝලික ජනතාවට සාධාරණයක් ඉටු කරන ලෙස. නීතිය නිසිලෙස ඉටු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.ඒ වාගේම මෙය එයට අදාළ නොවුණත් මෙම සභා වාරයේදී කතා කළයුතු ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි,මට පෞද්ගලික ප්‍රශ්නයක් ඇතිවුණා.මන්ත්‍රීවරයෙක් ලෙස සියලුදෙනා වෙනුවෙන් මම කථා කරන්නේ.ජූලි මාසේ 9වෙනිදා ගෝඨාභය ජනාධිපතිවරයා පන්නලා, අගමැතිතුමාගේ නිවසට ගිනි තියලා ඉවර වුණාට පස්සේ 10වෙනිදා හවස 5.00ට විතර මගේ නිවසේ සිට හංදියට එනකොට මහින්ද රාජපක්ෂ මහතා දුන්න රජයේ යතුරුපැදියකින් මන්ත්‍රීවරයෙක් මගේ ඉදිරියට ඇවිත් උජාරුවෙන් නැවතුනා. සහෝදර මන්ත්‍රීවරයෙක් නිසා මම කතා කළා.එවිට මට කියනවා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී නේද කන්ඩ ලෑස්තිවෙලා ඉන්න ඔයත් ලිස්ට් එකේ ඉන්නවා කීවා.මගේ ගමේ ඉඳගෙනම කියනවා එහෙම. මොනවා වුණත් අපිත් එක්ක ඉන්න මන්ත්‍රීවරයෙක් කියලා මම මොනවත් කීවේ නෑ.බොරුවට කොහේවත් නැති හයියක් අරගෙන එහෙම කියනවා. මම කියන්නේ සියලුදෙනාගේම ගෞරවය ආරක්ෂා කරන්න කියලා. මේ වගේ පහත් නින්දිත කතා කියන්න එපා.ස්තූතියි.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

බොහෝම ස්තූතියි ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතාට.අදහස් ඉදිරිපත් කරන්න තවත් අවස්ථාව ලබාදෙනවා ගරු මන්ත්‍රීවරුන්ට.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී. නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා-(එ.ජ.නි.ස.)**

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ දේශපාලන ඉතිහාසයේ අපි නොසිතු ලෙස තමා ජනාධිපති ලෙස රනිල් වික්‍රමසිංහ මහතා පත්වෙන්නේ.අපි දේශපාලන වශයෙන් ගත්තාම අපේ රටේ තදබල ක්‍රියාන්විතයක් ලෙස

දකින්න පුළුවන් ජීවන බර,ආර්ථික අපහසුතා, තෙල් අර්බුද ආදි මේ කරුණු මුල් කරගෙන අති දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් මුල් කරගෙන ගෝඨාභය ජනාධිපතිවරයාට තනතුර අතහැර යන්න සිදුවුණා. ජනාධිපතිතුමාට ධුරයෙන් අස්වෙන්න සිදුවීමත් සමඟ සියලු මන්ත්‍රී මණ්ඩලයට ඉවත්වන්න සිදුවුණා.ඉන් පසුව අපේ රටේ ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිධුරය අවසන්වීමට තව අවුරුදු 2ක් තිබෙන නිසා නීතිමය පසුබිම අනුව වැඩබලන ජනාධිපති ලෙසත් අනතුරුව බහුතර මන්ත්‍රී කැමැත්ත මත විධායක ජනාධිපති ලෙසත් රනිල් වික්‍රමසිංහ මහතා පත්වෙනවා. එතුමා පත්වෙන්නේ අපි ඡන්දය ලබා දීලා පාර්ලිමේන්තු යවපු මන්ත්‍රී වරුන්ගේ බහුතර කැමැත්ත මතයි. විධායක ජනාධිපති ලෙස රනිල් වික්‍රමසිංහ මහතා නිල වශයෙන් රට බාර ගන්නවා. පක්ෂ පාට භේද නෑ දැන් එතුමා තමයි ගරු ජනාධිපති. එතුමා තමයි ගරු අග්‍රාමාත්‍ය ලෙස දිනේශ් ගුණවර්ධන මැතිතුමා පත් කරන්නේ. එතුමන්ලාට රටේ ගැටලුකාරී තත්වය නිමා කරමින් රට යථා තත්වයට පත් කිරීමට හැකිවේවායි සුභාශිංෂන එකතු කරනවා. මේ වනවිටත් රට දැවැන්ත අර්බුදයක තමයි තියෙන්නේ.විශාල මරණ සංඛ්‍යාවක් මේ පෝලිම්වල සිදු වුණා.මේ සියල්ලම අවසන් කරලා රට සාමාන්‍ය තත්වයට ගේන්න මෙම දෙපළට හැකිවෙන්න ඕනා.මේ අරගලය නිර්මාණය වුණේ මේ පොහොර ප්‍රශ්නය නිසා.පසුව ගෑස්, ඉන්ධන, බඩුමිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් මේ අර්බුදය වැඩිවුණා.අවසානයේ ජනාධිපතිධුරය අතහරින්න සිදුවුණා එතුමාට.රජයේ කාර්යාල, නිවෙස් මේ අරගලයෙන් විනාශ කරලා සමහරු පටු අරමුණු වෙනුවෙන් අරගලයේ සැබෑ අරුත විනාශ කරලා දැම්මා.මේවා මුල්කරගෙන නැවත ඒවා ඇතිනොවෙන්න වර්තමාන ජනාධිපතිවරයා ව්‍යවස්ථා බලය අතට අරගෙන කටයුතු කරාවි.මේ වැටුණු ආර්ථිකය ගොඩ ගන්න අපි අවස්ථාවක් දෙන්න ඕනා.මේ වනවිට ව්‍යාපාර සියලුම ආදායම් මාර්ග සියල්ල ඇණහිටලා තියෙන්නේ.විශේෂයෙන්ම ඩොලර් අර්බුදයක් නිර්මාණය වුණා.ඉතින් සංචාරක ව්‍යාපාරය නැවත ආරම්භ කරන්න කාලය ගන්න ඕනා.එතුමාලා ආරාධනා කරනවා සියලුම දේශපාලන පක්ෂවලට සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදන්න.රට ගොඩ නඟන්න අපි එතුමාට සහයෝගය ලබාදෙමු.නව ජනාධිපතිතුමා මුළු ලෝකයක් පිළිගන්න නායකයෙක්.ඉතින් නව ජනාධිපතිවරයාටත් නව අගමැතිවරයාටත් රට ගොඩ නඟන්න ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරු නියෝජනය කරමින් තමයි ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා මෙම සුබ පැතුම් යෝජනාව ඉදිරිපත් කරන්නේ. එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, අද අගෝස්තු මාසේ 9 වෙනිදා.හරියටම මීට මාස දෙකකට පෙර ජූනි මාසේ 9වෙනිදා අරලියගහ මන්දිරයට ගිය පිරිසක් එතනින් ගෝල්පේස් එකට කරපු ප්‍රහාරයත් එක්ක කුපිත වෙච්චි ජනතාව පාරට බැහැලා විවිධ ක්‍රියාවල යෙදුණා.ඒ විතරක් නෙවෙයි අපිට යෝජනා ආවා වෘත්තීය ක්‍රියාමාර්ග ගමු කියලා.සාමකාමී අරගලයක යෙදිලා හිටිය ජනතාවට පහරදීම සම්බන්ධයෙන් අපිටත් වේදනාවක් තිබුණා.ඒ නිසා එයට විරෝධතා පළ කරලා අපි උද්ඝෝෂණ කිහිපයක් සංවිධානය කළා.විශේෂයෙන්ම මම එදා හවස හෙට්ටිපොල මූණමල්දෙනිය හා බණ්ඩාරකොස්වත්ත නගරවල උද්ඝෝෂණ 03ක්සංවිධානය කළා. අපි එය සූදානම් කරලා තොරතුරු විමසනකොට මට දැනගන්න ලැබුණා හෙට්ටිපොල නගරයේ අය දේශපාලන පක්ෂයක් වශයෙන් අපිට මෙහෙයව ගන්න බැරි පිරිසක් කියලා.අපිට හසුරුව ගන්න බැරි පිරිසක් කියලා.ඒ නිසා හෙට්ටිපොල නගරයට රැස්වූ අපේ ජනතාවට මම කීවා මූණමල්දෙනිය හා බණ්ඩාරකොස්වත්ත නගරවලට ස්ථාන ගතවෙලා උද්ඝෝෂණ ක්‍රියාවේ යෙදෙමු කියලා.නමුත් එදා අවාසනාවන්ත සිදුවීමක් සිදුවුණා.අපේ ප්‍රාදේශීය බල සභා ප්‍රදේශයේ මන්ත්‍රීවරුන්ගේ නිවාසවලටත් පහර දීම් කරලා තිබුණා.ඒකට විශාල පිරිසක් අත්අඩංගුවටත් අරගෙන තිබුණා.අපට පුරෝකථනයක් තිබුණා මෙහෙයවීමට නොහැකි ජනතාවක් ඉන්න තැන එහෙම දෙයක් වළක්වන්න බැරිවෙයි වෙයි කියලා.අපි උද්ඝෝෂණ කළ තැන් දෙකේත් සමහර අය යෝජනා කළා විශේෂයෙන්ම මූණමල්දෙනියේ පවා. බණ්ඩාරකොස්වත්තේ අපේ සරත්චන්ද්‍ර මන්ත්‍රීතුමාගේ කඩයක් තියෙනවා නමුත් අපි ඒ කිසිම දේකට හානියක් වෙන්න අපි ඉඩදුන්නේ නෑ,දේශපාලන පක්ෂයක් වශයෙන්.හෙට්ටිපොල උසාවියේ පොලිස් මුරපොලට හෝ උසාවියට අපි කිසිම කෙනෙක් සම්බන්ධ වුණේ නෑ.හේතුව තමයි මේ අරගලය ආණ්ඩුව මාරු කරන අරගලයක් හා ජනතාවගේ සාධාරණ අරගලයක්.සාමාන්‍ය ජනතාවත් එක්ක හෝ ප්‍රාදේශීය මන්ත්‍රීවරුත් එක්ක අරගලයක් නෙවෙයි.ඒ නිසා ගරු සභාපතිතුමනි, අගමැති හා ජනාධිපති ඉවත්වෙලා තිබෙනවා. මීට අවුරුදු දෙක හමාරකට පෙරත් මේ වගේම ගෝඨාභය රාජපක්ෂ මහතාටත් යෝජනාවක් සම්මත කරගෙන සුබ පැතුවා. ඒ නිසා මම කියන්න යන්නේ යෝජනාවට ඕනකෙනෙකුට සුබ පතන්න ඕනා ඉතිහාසය බලලා.දේශපාලන ඉතිහාසයේ ක්‍රියාකාරිත්වය බලලා තමයි සුබ පතන්න ඕනේ.මම හිතන්නෑ රටේ ජනතාව සුබ සිහින තියා ගනියි කියලා.

හේතුව පාස්කු ප්‍රහාරයේ ප්‍රධාන චූදිතයෙක් තමා වත්මන් ජනාධිපතිතුමා.වෘත්තීය නිසා එතුමා එයින් ඉවත්වෙනවා. කෙසේ වෙතත් අපි අරගලය ඇතුළේ සාමාන්‍ය මන්ත්‍රීවරුන්ට හෝ සාමාන්‍ය ජනතාවට පක්ෂයක් ලෙසින් ඇඟිලි තුඩකිනවත් හානියක් වෙන්න ඉඩ තිබ්බේ නෑ.නමුත් මලින්ද ඩයස් ගරු මන්ත්‍රීතුමා කීව සිදුවීමට මුහුණ දෙන්නේ මම. අපි ඒ ස්ථානයේ උද්සෝෂණයක් සූදානම් කරලා තිබුණේ. ඇත්තටම අපි හමුවුණාම කථා කරන විදියක් තියෙනවා.එතුමාත් මා සමඟ සුහදව කථා කරන්නේ.නමුත් මම සුහදශීලිව කථා කළ එක එතුමා වැරදියට තේරුම් අරගෙන තියෙන්නේ. එතුමා හිටිය මානසිකත්වය මම දන්නවා. අපි උද්සෝෂණයක් සූදානම් කරලා තිබුණා අපි ඒක සාර්ථක කර ගත්තා. ඇඟිලි තුඩකිනවත් හානියක් වෙන්න ජාතික ජනබලවේගය ලෙස හෝ ජනතා විමුක්ති පෙරමුණ ලෙස මේ ප්‍රාදේශීය බල සභා ප්‍රදේශයේ කිසිම මන්ත්‍රීවරයෙකුට ඉඩ සැලසුවේ නෑ.අරගලය තිබුණේ ආණ්ඩුව එක්ක. සාමාන්‍ය මන්ත්‍රීවරු සමඟ අපිට ගැටුමක් නෑ.ඒ නිසා ඉදිරියටත් එහෙමයි. මොකද 88-89 කාලයේත් අපිව පටලව ගන්න උත්සාහ කළා.මෙවර අපි පැටලෙන්නැතුව බොහෝම ඉවසිලිමත්ව අපිට බේරගන්න පුළුවන් මට්ටමෙන් බේරගෙන දේශපාලන වශයෙන් ඉදිරියට යනවා.ඒ නිසා මෙතැන ඉන්න මන්ත්‍රීවරු සමඟ හෝ සාමාන්‍ය ජනයා එක්ක අපට අරගලයක් නෑ.අපට ගැටුමක් නෑ.අපට ගැටුම තියෙන්නේ මේ රටේ තියෙන විදෙස් සංචිත හිස් කළ ඒ පාපී ඉතිහාසයත් එක්ක. ඒක නැවත ප්‍රතිනිර්මාණය කරන්න අර්බුදය නිර්මාණය කළ අයට අර්බුදය විසඳන්න බැරි බව අපි දන්නවා. ඒ නිසා තාවකාලික පැලැස්තරවලින් මේ ප්‍රශ්නය විසඳන්න බෑ. මේ ප්‍රශ්නයට අපිට දැනුත් මුහුණදෙන්න වෙනවා.අනාගතයේදීත් මුහුණ දෙන්න වෙනවා.ඒ නිසා මට කියන්න තියෙන්නේ සුබ පැතීම කල් දමන්න වෙයි.ඒක කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා අපි ඉතිහාසයෙන් දන්නවා. අරගලය තිබුණේ ආණ්ඩුවත් එක්ක. අරගලය තිබුණේ පාලකයොත් එක්ක. අද අගෝස්තු මාසේ 9වෙනිදා රට පුරා උද්සෝෂණ කරනවා.නමුත් පාලකයා එලවන්න නෙවෙයි මර්ධනයට විරුද්ධවයි.අත්අඩංගුවට ගන්නවා. උසාවි දානවා. හිරේ දාන්න සූදානම් කරනවා.පාර්ලිමේන්තු බහුතරයෙන් ජනාධිපති වෙලා ඉතිහාසයේ වගේ මේ රට අගාධයට ගෙනියන්න දෙන්නේ නෑ. ඒ වගේම මේ පාර්ලිමේන්තුවට දැන් ජන මතයක් නෑ. ජන මතයක් නැති මේ පාර්ලිමේන්තුව වහාම විසුරුවන්න ඕනා.දැන් ජන මතයට ඉඩ දෙන්න ඕනා.අන්න එදාට අපට විදෙස් ආධාර, විදෙස් ණය ලැබෙයි.විදේශිකයන්ගෙන් මුදල් ලැබෙයි.මේ රට යහපත් තත්වයට ගේන්න පුළුවන් වෙයි.ඒ නිසා අරගලය තියෙන්නේ මෙතැන ඉන්න ඔබතුමන්ලා සමඟ නෙවෙයි. ඒක ආණ්ඩුවත් එක්ක අරගලයක්.පාලකයා සමඟ අරගලයක්. ඒ පාලකයා නිල් පාටද කොළපාටද අපිට අදාළ නෑ.අපි කාටත් තියෙන ප්‍රශ්න නිසයි මේ සටනේ යෙදිලා ඉන්නේ. අපි කවුරුත් ඒකෙන් බැට කනවා. දුක් විදිනවා.තවත් මේ ජනතාවට දුක් විදින්න බෑ.පෝලිම්වලට ගිහින් තෙල් ටික ගහගන්න නෑ.කන්න නෑ. හතලිස්පන්දහසකට සේලයින් දෙනවා දවසකට කන්න නැතුව.ඒ නිසා සුබ පැතීම කල් දාන එක හොඳයි. වෙන්නේ මොකද්ද කියලා අපිට පුරෝකථනයක් තියෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.සී.දසනායකමහතා මහතා - (එ.ජා.ප.)</u>**

ගරු මන්ත්‍රීතුමා පොඩි ප්‍රශ්නයක් තියෙනවා පැහැදිලි කරගන්න.පාස්කු ප්‍රහාරයේ ප්‍රධාන චූදිතයා වත්මන් ජනාධිපතිවරයා කියලා ඔබතුමා කියනවා. කොහොමද එහෙම කියන්නේ පැහැදිලි කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ චූදිතයෙක් ලෙස හිටපු ජනාධිපති, හිටපු අගමැති පිළිබඳ කොමිෂමේ වාර්තාවේ තියෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.සී.දසනායකමහතා මහතා - (එ.ජා.ප.)</u>**

වත්මන් ජනාධිපතිතුමා කියලානේ කලින් කීවේ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

සංජීව කරුණාසාගර මන්ත්‍රීතුමා මේ ගරු සභාව පාර්ලිමේන්තුව කරගන්න එපා. පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්.මේ යෝජනාව ගෙනල්ලා තියෙන්නේ පාස්කු ප්‍රහාරය ගැන කතා කරන්න නෙවෙයි,මේ අභිනවයෙන් පත් වූ ජනාධිපතිට හා අගමැතිට සුබ පතන්නයි.ඒකට ගරු සභාවට අයිතියක් තියෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)</u>**

අපේ මහ ගෙදර එක්සත් ජාතික පක්ෂය.ඉදිරි අනාගතයේදී අපේ පක්ෂ දෙක එකතුවීමක් වෙයි.අභිනවයෙන් පත් වූ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ගැන වචනයක් කිව යුතුමයි. අපි පොඩි කාලේ පටන් දේශපාලනය කරන පුද්ගලයෝ. රනිල් වික්‍රමසිංහ මහතාට බැන්නේ දේශපාලන වාසි ලබා ගන්න හොරා, රට වික්කා, කොටියට රට දුන්නා.තමන්ගේ දේශපාලන අරමුණු ඉටු කරගන්න සිංහල, මුස්ලිම්, දෙමළ භේද

ඇති කරලා ඒ සියල්ලගෙන්ම බැලුම් ඇහුවේ එතුමා.එතුමාගේ පාලන බලය කාලේ රටේ තරුණ ප්‍රජාවට තමයි එතුමා බොහෝ වැඩ කොටසක් කරලා දුන්නේ. යොවුන් සේනාංක, තරුණ සේවා සභා, යොවුන් පෙරමුණ වගේ තරුණයන් ඉලක්ක කරගත් බොහෝ වැඩසටහන් එතුමා ඇති කරලා තියෙනවා.විද්‍යාපීඨ ,බුදුපුත් රක්ෂණය,පිරිවෙන් අධ්‍යාපනය ඇති කරලා අධ්‍යාපනයට දැවැන්ත මෙහෙවරක් කළා.සුව සැරිය විශාල මෙහෙවරක් කරනවා සමාජයට. ඒ වගේම හැම දිස්ත්‍රික්කයකම කාර්මික ආයතනයක් ආරම්භ කළා එතුමා.තරුණයන්ට ඉගෙන ගන්න මිසක් කැරළි ගහන්න නෙවෙයි. යොවුන් සේනාංකවල ඉගෙනගෙන ජීවිතය ජයගත්තු තරුණයෝ ඉන්නවා එතුමාට පිං සිද්ද වෙන්න. එතුමාගේ වැරදි අඩුපාඩු ඇති. නමුත් එතුමා මේ රටට කළ සේවය විශාලයි.අද මේ ඉන්ධන නැති වෙලාවේ සුවසැරිය ගම්වල යනවා අපි දකිනවා.ලෙඩුන්ට මොනතරම් සේවයක්ද ඒක.මෙතුමාගේ කාලේ ප්‍රේමදාස මහතාගේ ආණ්ඩුව තමා අහිංසක දරුවන්ට පාසල් නිල ඇඳුමක් දුන්නේ.කෑමවේල දුන්නා.කිරි වීදුරුව දුන්නා. අද කිසිමදෙයක් නෑ.මේ වගේ සේවයක් කරපු එක්සත් ජාතික පක්ෂයත් එක්ක අනිත් පක්ෂවලට හැරෙන්නවත් බෑ.74න් පස්සේ විවෘත ආර්ථිකයෙන් මේ රට විනාශ කළා කියනවා.එහෙම කළේ පාලකයෝ.එම ක්‍රමවේදය හරියට කළා නම් අද මෙහෙම වෙන් නෑ. ශ්‍රී ලංකාවට විවෘත ආර්ථිකය ඇවිත් අවුරුදු 20කට පස්සේ තමයි ඉන්දියාවට විවෘත ආර්ථිකය ගෙනාවේ.අද ඉන්දියාවයි ශ්‍රී ලංකාවයි තිබෙන තැන හොඳට හිතලා බලන්න.මේ රටට දැවැන්ත සේවයක් කළ නායකයෙක් රනිල් වික්‍රමසිංහ මහතා. ඉතින් එතුමාට තමයි මේ රට ගොඩගන්නත් පුළුවන්. ඉන්ධන පෝලිම් දැන් ටික ටික අවසන් වෙනවා. යහපාලන ආණ්ඩුව අවුරුදු දෙක හමාරක් තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයට ගෙනාව ව්‍යාපෘතිය ගත්තොත් ලංකාවේ විශාලම කර්මාන්තපුරය ගෙනාවා බිංගිරියට.ඒක ක්‍රියාත්මක වුණානම් අද තරුණ තරුණියන් විශාල පිරිසකට රැකියා ලැබිලා.අදටත් ප්‍රේමදාස මහතා හඳුන්වා දුන්නු ඇඟලුම් කම්හල් ව්‍යාපාරය නිසා තමයි මේ රටට ඩොලර් ලැබෙන්නේ.කුලියාපිටියට ගෙනාවා ශික්ෂණ රෝහල.ඒ නිසා අපේ ගම්වල අහිංසකයන්ට කොළඹ යන්න ඕන නෑ කුලියාපිටිය රෝහලෙන් ඒ පහසුකම් ලබා ගන්න පුළුවන්.නව තාක්ෂණයෙන් මේ රට ඉදිරියට ගෙනාවේ එතුමා.විපක්ෂ නායකතුමා ගත්තොත් එතුමා පාසල් ගණනාවකට බස් රථ පරිත්‍යාග කරලා තියෙනවා. එතුමාත් රටට සේවය කරන නායකයෙක්.ජනාධිපතිතුමාගේ ඉල්ලීමට අනුව රටට වැඩක් කරන්න පුළුවන් සජිත් ප්‍රේමදාස මහතාත් ජනාධිපතිතුමා සමඟ සහයෝගයෙන් වැඩ කරයි.විපක්ෂයේ හුස්මක් වැඩසටහන යටතේ රටට සේවය කළ නායකයෙක්. අපි හිතනවා එතුමා මේ තිබෙන තත්වයෙන් රට ගොඩගනී කියලා.ඉන්ධන ප්‍රශ්නයට හොඳ විසඳුමක් දීලා තියෙනවා.දැන් පෝලිම් අඩුවෙලා ඒ නිසා. 88-89 යුද්ධයක් තිබුණ කාලේ ඍජු තීරණ ගන්න නායකයෙක් විදියට විසඳුමක් දුන්නා.ඒ කාලේ ලංගම බස් 550ක් ගිනි තියලා තිබුණා.ඩිපෝ 12ක් පිච්චුවා.ට්‍රාන්ස්පෝමර් 130ක් විනාශ කළා.අපිට ඒ ඉතිහාසය මතකයි.ඒ රැල්ල ආයෙත් හැදුවා. නමුත් රැල්ල නැතිවුණා.මේ අරගලය කළේ තරුණ ප්‍රජාව කුපිත කරවලා.ඉතින් මේ සියල්ලටම විසඳුම් ලැබෙයි.දක්ෂ නායකයෙක් විදියට එතුමා ප්‍රශ්නවලට විසඳුම් ගෙනෙයි.එතුමාගේ නිවසට ගිනි තිබ්බා.ඒ එතුමාගේ පුස්තකාලය.මේ දේවල් මේ රැලි නවත්වන්න දන්නවා එතුමා බුද්ධිමත් විදියට.රුවන්වැලි සෑය ලඟදි එතුමාට හූ කිව්වා.අපහාස කළා. මම දකින විදියට රනිල් වික්‍රමසිංහ මහතා කිසිම දේශපාලඥයෙකුට මඩ ගහලා නෑ.දැනුම් සම්භාරයක් තියෙන පුද්ගලයෙක් රනිල් වික්‍රමසිංහ මහතා.අරගල කරන්න කරන්න අපිටම තමා පෝලිම්වල ඉන්න වෙන්නේ. අපි එතුමාට අවස්ථාව දීලා බලමු. අපි එතුමාට සුබ පතනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, නිවැරදි කිරීමක් කරන්න ඕනා. සංජීව කරුණාසාගර මන්ත්‍රීතුමා කීවා 9වෙනිදා පිරිස පාලනය කරගන්න බැරි නිසා හෙට්ටිපොලෙන් පිටත් වුණා කියලා.නමුත් එහෙම නෙවෙයි වුණේ.එතුමාලා සමාජ මාධ්‍ය (whatsapp group)හරහා උසි ගැන්වීම් කළේ.ජයන්ත හේරත් මහතාගේ නිවසට ගිනි තියන්න දෙපාරක් උසි ගැන්වීම් කළා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

මම කියනවා පුළුවන්නම් අපේ සමාජ මාධ්‍ය (whatsapp group) පෙන්වන්න කියලා. ගරු සභාවට බොරු කියන්න එපා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

මට කථා කරන්න දෙන්නකෝ.හරි මම පෙන්වන්නම්.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

සංජීව කරුණාසාගර මන්ත්‍රීතුමා මේ ජයන්ත හේරත් මන්ත්‍රීතුමාගේ අවස්ථාව. මේ ස්වාධීන අදහස් ප්‍රකාශ කරන්නේ.ජයන්ත හේරත් මන්ත්‍රීතුමා ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කරලා වාඩිවෙන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

එතුමා පුළුවන් තරම් කළේ හෙට්ටිපොලට පිටින් තරුණ පිරිස් ගෙන්වලා ජයන්ත හේරත්ගේ නිවසට ගිනි තියන්න කියලා මෙතුමා කීවා.දෙතුන් සැරයක් කීවා.මා ළඟ තිබෙනවා සමාජ මාධ්‍ය (whatsapp group)වල තොරතුරු.මට උත්තර දෙන්න පුළුවන්.මෙතුමා තමා උසි ගැන්වූයේ. හෙට්ටිපොල අරවින්ද මන්ත්‍රීතුමාගේ නිවසට ගිනි තියන්න. අරවින්ද මන්ත්‍රීතුමා මොන වරදක් කළාටද? අපි දේශපාලන භේදයකින් තොරව මිනිස්සු ආශ්‍රය කරන නිසා අපේ නිවස බේරුණා.එදා ගිනි තැබුවා නම් මට මේ ප්‍රජා ශාලාවේ තමා ඉන්න වෙන්නේ.මේවා සහගහන අපරාධ.මේවා කරන්න එපා. මේ පවතින අර්බුදයට වගකියන්න ඕනා මේ ජනතා විමුක්ති පෙරමුණ.මේ රටේ රාජ්‍ය දේපල කොච්චර විනාශ කළාද? ඒවාට වගකියන්න ඕනා මේ ජනතා විමුක්ති පෙරමුණ. වෙල් ගිනි තියන්න වෙඩි තියන්න සංජීව මන්ත්‍රීතුමා එන්න. අපි දැන් ඕනදේකට සූදානම්.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

හොරකම් කළේ අපිද? නෑ නෑ අපි එන්නේ නෑ ඔබතුමාලා කීවාට.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

කරුණාසාගර මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාවට කවුරුත් මන්ත්‍රීවරු බාධා කළේ නෑ. ඔබතුමා කතා කරද්දී මන්ත්‍රීවරුන්ට කියන්න දේවල් ඇති.ඔබතුමාට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබුනානේ. ජයන්ත හේරත් මන්ත්‍රීතුමා කෙටියෙන් අදහස් ප්‍රකාශ කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමා, මේක රීති ප්‍රශ්නයක්. මෙතුමා මාව ඉලක්ක කරගෙන අසත්‍ය ප්‍රකාශ කරන්නේ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඔබතුමා කරුණාකරලා වාඩිවෙන්න. අපි මේ ගරු ජනාධිපතිතුමාටයි ගරු අග්‍රමාත්‍යතුමාටයි සුබ පැතීමයි සිදු කරන්නේ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

මේ සුබ පැතීම නෙවෙයිනේ කරන්නේ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

මන්ත්‍රීතුමා කරුණා කරලා වාඩිවෙන්න. ඔබතුමාට නැගිට නැගිට කතා කරන්න දෙන්න බෑ. ඔබතුමාට කලින් අවස්ථාව දුන්නා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ඒ වුනාට බොරු කියන්න දෙන්න බැනේ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඔබතුමාට කලින් අවස්ථාව දුන්නා අදහස් ප්‍රකාශ කරන්න.ඒ වෙලාවේ කවුරුත් වාද කළේ නෑ. ජයන්ත හේරත් මන්ත්‍රීතුමාටත් හිත් රිදීමක්, කළකිරීමක් ඇති.ඒවා මෙතන කතා කරන්න එපා.වෛරී දේශපාලනය මෙතනට අවශ්‍ය නෑ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

මේ වෛරී දේශපාලනය තමා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, මෙතුමා තමයි සමාජ මාධ්‍ය (whatsapp group)වලින් කට්ටිය උසි ගන්වලා ගෙවල් ගිනි තියන්න කීවේ.මම ඒක වගකීමෙන් කියනවා.ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පැතීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. ගරු සභාපතිතුමා කතා කරන්න දෙන්නේ නැනේ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

රීති ප්‍රශ්නයක් තියෙනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනයක් නැද්ද? ඔබතුමා මොකද්ද කරන මේ වැඩේ? ඔබතුමා කියන දේවල් සියලුදෙනා අහන්න ඕනා. මේ ගරු සභාවට විනයක් තියෙනවා. මේ යෝජනාවට අදහස් දක්වන්න

ඔබතුමාට අවස්ථාව දුන්නා. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඔබතුමාට වගේම අනිත් අයටත් තියෙනවා. කරුණාකරලා ඔබතුමා වාඩිවෙන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

රීති ප්‍රශ්නයක් තියෙනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

කිසිම රීති ප්‍රශ්නයක් නෑ.නමුත් ඔබතුමා තවත් මන්ත්‍රීවරයෙක් අදහස් ඉදිරිපත් කරද්දී බාධා කිරීම ගැන නම් රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ඔබතුමාට රීති ගැන අවබෝධයක් නෑ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මේ දේශපාලන පැටිකිරිය ගැන මම හොඳට දන්නවා.මම ඒ ගැන කතා නොකරන්නේ මේක නිර්පාක්ෂික සභාවක් ලෙස තියාගන්න අවශ්‍ය නිසා. ඒ නිසා ඔබතුමා නිශ්ශබ්ද වෙන්න.ජයන්ත හේරත් මන්ත්‍රීතුමා දැන් කෙටියෙන් අදහස් දක්වන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රාමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පතන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අවුරුදු දෙක හමාරක් ආණ්ඩුව කරලා තමයි පිටව ගියේ.මේ අපේ ඉතිහාසයේ එක දවසක් රජ කළ රජවරු ඉන්නවා. අනුරාධපුර යුගයේ සොත්තිසේන රජතුමා, පොළොන්නරු යුගයේ වීර පරාක්‍රමබාහු රජතුමා වැනි රජවරු එක දවසක් රජකම් කළ අය ඉන්නවා.ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම කීවා මේ අපේ එක මන්ත්‍රීතුමෙක්ගේ හැසිරීම ගැන.නමුත් අපි විනීතව අපිට ඡන්දය දුන්න ජනතාවට ගෞරවයක් වෙන විදියට තමා හැසිරෙන්නේ.ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට පවතින අර්බුදකාරී තත්වයෙන් රට මුදාගෙන ජනතාවට සහනදායි කාලයක් උදා කරදීමට හැකිවේවායි අපි හදවතින්ම සුබ පතනවා.බොහොම ඉවසීමෙන් වැඩ කරන වත්මන් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට නැවතත් මම හදවතින්ම සුබ පතනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, දේශපාලනය ගැන විශේෂයෙන්ම ජේ.වි.පී.ය ගැන අපි කතා කරන්න අවශ්‍ය නෑ.1971 සිට මේ රට භීෂණ තුනකට විතර මුහුණ දුන්නා.මේ රටේ මිනිස්සු හැටදාහක් පමණ මැරුවා.88-89 භීෂණය ඇති කළා.බස් 500ක් විනාශ කළා.අපි කතා කරන්නේ හැමවිටම රට වෙනුවෙන්.අරගලය ජයග්‍රහණය කළා කියලනේ ඔබතුමා කියන්නේ.නමුත් සැබෑ තත්වය ජනතාව අවබෝධ කරගනියි. පවතින තත්වයත් එක්ක ජනාධිපතිවරයා පත්කලේ මේ රටට වැඩ කරන්න. සමහර පක්ෂ එතුමාට සහය දෙන්නෑ කියනවා.රටට ආදරේ ඒ අයලු. රටේ ජනාධිපති ධූරය ලබා ගන්න තමයි ඒ අය උත්සාහා කරන්නේ.නමුත් මේ රටේ ජනතාව දන්නවා ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ කවුද කියලා. අහිංසක දරුවෝ විශ්වවිද්‍යාලයට ගියාම ඒ දරුවන්ගේ මනස විකෘති කරලා අරගලකරුවෝ කළා.මේ රටේ අරගලකරුවෝ 75දෙනයි හිටියේ. ඒක ජනතාව දන්නවා.ඔබතුමන්ලා පාර්ලිමේන්තු යන්නනම් ජනතාව ඡන්දය දෙන්න ඕනා.මේ රටේ ඇතිවූ අරගලයට ඔබතුමාලා තමා වගකිවයුත්තේ. ගෝඨාභය රාජපක්ෂ මහතා තමා මේ රටේ හිටිය හොඳම ප්‍රජාතන්ත්‍රවාදී නායකයා.එතුමා අවුරුදු 22ක් ආරක්ෂක නිලධාරියෙක් විදියට හිටියා.කිසිම කෙනෙකුට හිංසාවක් කරලා නෑ. එතුමා නීතිය, බලය අතට ගත්තේ නෑ.පළවෙනි කැරැල්ලේදී එක වෙඩිල්ලක් පත්තු කළානම් අද ඔබතුමාලා මේ විදියට ඉන්නේ නෑ.ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිහතමානී බව නිසයි ඔහුට එහෙම වුනේ.අවුරුදු 70ක් තිස්සේ ආණ්ඩු කළ කිසිම කෙනෙක්ට ජාතික ප්‍රතිපත්තියක් තිබුණේ නෑ.අධ්‍යාපනයටවත් ජාතික ප්‍රතිපත්තියක් තිබුණේ නෑ.කොරෝනා තත්වය නිසා තමයි මේ රට කඩාවැටුනේ.එයට එතුමා හේතුවක් නෙවෙයි.මහින්ද රාජපක්ෂ මහතා කරපු දේවල් අද අමතක වෙලා. මේ රටේ භීෂණය වැපිරුවේ ඔබතුමාලා.තව අවුරුදු 10ක් ගියත් මේ රට ඔබතුමාලාට බාර දෙන්නේ නෑ.අපේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල් කැඩුවේ ගිනි තිබ්බේ ඔබතුමාලා. පක්ෂ නායකවරයා කැඳවීමක් කළාම අපි යන්න ඕනා.අපි ගියේ අරගලයකටවත් ගහන්නවත් නෙවෙයි.අපි මේ රට විනාශ කළේ නෑ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමනි, මුලින්ම ස්තූතිවන්ත වෙනවා ගරු මන්ත්‍රී මලින්ද ඩයස් මහතාට ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පතන්න අවස්ථාවක් උදා කර දීම ගැන. අපි දන්නවා ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රට බාර අරගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහයෝගය ඇතිව මේ රටේ ජනාධිපති බවට පත් වුණා.අවුරුදු දෙක හමාරක් යාමට පෙර එදා පැවති වාතාවරණය සමඟ කොරෝනා තත්වයත් එක්ක තිබුණ අර්බුදකාරී තත්වයත් සමග පැන නැගුණු මේ රටේ ආර්ථික තත්වය කඩා වැටීමට ලක් වුණා. මේ තත්වයත් එක්ක ලෝකයේ සෑම රටකින්ම අපට ඩොලර් ලැබීමේ මාර්ග අවහිර වුණා. ඩොලර් අර්බුදය ලංකාවට විතරක් නෙවෙයි මුළු ලෝකෙටම ඇතිවුණ ප්‍රශ්නයක්.අනතුරුව අරගලය නිර්මාණය කරනු ලැබුවා. මෙයට පැහැදිලිව වගකිව යුත්තේ ජනතා විමුක්ති පෙරමුණමයි. ජනතා විමුක්ති පෙරමුණ මෙය සංවිධානාත්මකව කටයුතු කරලා තරුණ පිරිස් යොමු කරලා ගෝල්පේස් ගෙනහින් අරගලය නිර්මාණය කරනු ලැබුවා. ඒ නිසා තමයි මේ රටට සංචාරකයෝ එන එක නැවතුනේ. මේ නිසා රටවල් කිහිපයක් තහංචි දැම්මා ලංකාවට යන්න එපා කියලා. අරගලය නිසා තමා ගෝඨාභය රාජපක්ෂ මහතාට දවසින් දවස මේ රට පාලනය කරගන්න බැරි වුණේ. ගෝඨාභය රාජපක්ෂ මහතා තමා රුපියලක්වත් හොරකම් නොකළ එකම නායකයා.එදා 78 ඉඳන් ආව ආර්ථික අරගලයට එතුමාට මුහුණ දෙන්න සිදුවුණා.අහිංසක මිනිසෙක් විදියට අවසානේ එතුමාට නිවසකුත් නැතිවුණා.රටින් පලා යන්න සිදුවුණා.මම දන්න විදියට ජනතා විමුක්ති පෙරමුණ ගම්වල පොඩි පොඩි රැස්වීම් පවත්වන්න යනවා.නමුත් දැක්මක් නෑ. කරන දෙයක් නෑ.වැඩ පිළිවෙලක් නෑ. පම්පෝරිය ගහලා යනවා විතරයි. ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් වුණාට අපි කවදාවත් ඡන්දය දීලා නෑ.ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගෝඨාභය රාජපක්ෂ මහතා කරන්න බැරිවුණ දේ කරන්න පටන් ගත්තා හොඳ ප්‍රතිපත්තියක් සහිත නායකයෙක් විදියට.අද අරගලයක් නෑ. නමුත් අරගලයක් නිර්මාණය කරන්න හදනවා.නමුත් අපි හිතනවා ලංකාවේ නැවත එවැනි අරගලයක් නිර්මාණය කරන්න බැරිවෙයි.අරගලය මුවාවෙන් ජනතා විමුක්ති පෙරමුණ හිතනවා මේ රටේ බලය ලබා ගන්න.ඒ නිසයි මැතිවරණයක් ඉල්ලන්නේ.ජනාධිපතිවරයා පත් කරන වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහතා 134ක් ඡන්ද ගන්නකොට ඩලස් අලහප්පෙරුම මහතා 84ක් ඡන්ද ගන්නකොට අනුර කුමාර දිසානායක මහතාට බැරි වුණා එක මන්ත්‍රීවරයෙක් හදාගන්න.මන්ත්‍රීවරු 3දෙනා විතරමයි.ඉතින් කොහොමද ගමේ ඡන්ද හදාගන්නේ?ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා බඩුමිල අඩුකරන්න උත්සාහා කරමින් ඉන්නවා.නැවත අරගල කරලා ජනතාව අපහසුතාවට පත් කරලා බඩුමිල වැඩි කරවන්නයි හදන්නේ.මම සුබ පතනවා ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාටත් නව කැබිනට් මණ්ඩලයටත් මේ අවුරුදු දෙක හමාර තුළ ශ්‍රී ලංකාවේ ආදරණීය ජනතාවට මේ අසීරු අවස්ථාවේ සේවය කරන්න ලැබෙන්න කියලා.නිදහස් පක්ෂ මන්ත්‍රීවරු විදියට අපි සුභාශිංෂන එකතු කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, රටේ ඇතිවුණ තත්වයත් එක්ක ගරු රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරය බාරගත්තා.මම එතුමාට සුභ පතනවා මේ රටේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ඒ කාර්යභාරය බාර ගැනීම පිළිබඳව.ඒ වගේම පරිණත දේශපාලකයෙක් වන දිනේශ් ගුණවර්ධන මැතිතුමාටත් අගමැති ධුරය ලබා මේ රටට සේවය කරන්න ලැබීම පිළිබඳව සුභ පතනවා. ඒ වගේම මම පොඩි දෙයක් කියනවා.විශේෂයෙන්ම “අපි ප්‍රචණ්ඩකාරී ක්‍රියා කළේ නෑ” කියලා මගේ සහෝදර ජ.වි.පෙ. මන්ත්‍රී කීවාට අනුර කුමාර මන්ත්‍රීවරයා පැහැදිලිවම ප්‍රකාශ කළා“අරගලය කියන්නේ අපි කියලා. ශිෂ්‍ය සංවිධාන,විශ්වවිද්‍යාල සංවිධාන,වෘත්තීය සංගම් සියල්ල අපේ.අරගලය කළේ අපි” කියලා එතුමා බාර අරන් ඉවරයි.ජනතා විමුක්ති පෙරමුණේ අය අරගලය වරදිනකොට එය බාර නොගත්තාට හරියනකොට ඒක කළේ අපි කීවා.පොළොන්නරුවේ මන්ත්‍රීතුමාව සතෙක් වගේ පාරේ මරා දැමීමේ සිද්දියට සම්බන්ධ චූදිතයන් 20දෙනා අතර ක්‍රියාකාරී ජේ.වි.පී.සාමාජිකයන් 4ක් හෝ 6ක් ඉන්නවා.ජනාධිපති මන්දිරය අල්ලා ගත්තාය කියලා පිහිනුම් තටාකේ බැහැලා සබන් ගාලා නෑව සාමාජිකයා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රාදේශීය මට්ටමේ නායකයෙක් ගාල්ල දිස්ත්‍රික්කයේ.මිරිහානේ නිවසේ තමා ජනාධිපතිතුමා ජීවත් වුණේ.විශේෂ අවස්ථාවන්වලදී පමණයි එතුමා ජනාධිපති මන්දිරයට සහභාගී වුණේ. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර හිටපු මන්ත්‍රීවරිය ඒ නිවසේ එතුමාට ඉන්න දුන්නේම නෑ. එතුමා නිවසින් පිටව යනකල්ම කෑ ගැසුවා. ජනාධිපතිතුමා ජනාධිපති මන්දිරයට ආවෙත් ඒ නිසායි මම හිතන්නේ. ජනාධිපතිවරයෙක් විදියට අරගලකරුවන් කියන සුරසැප සමඟ තමා එතුමා ජීවත්විය යුත්තේ. ජනාධිපති මන්දිරයේ පිඟන්,කෝප්ප හැඳි ගෑරුප්පු පෙන්වලා මෙන්න ජීවත්වුණ හැටි කියලා ලෝකෙට කීවාට ඒක මම දකින්නේ ජනතා

විමුක්ති පෙරමුණේ කුහක සිතුවිලි කියලා.ඒ ඉරිසියා සිතුවිල්ල තමා තරුණ පිරිසට දීලා තියෙන්නේ.විශේෂයෙන්ම රෝහල්ගත කළ පිරිස ගත්තාම වයස අවුරුදු 16,17,18,19 වයස්වල පාසල් ළමයි.මගේ අත්දැකීමත් එක්ක මම කියන්නේ එදා 9වෙනිදා මම පුත්තලම ප්‍රදේශයේ හිටියේ.මටත් පණිවුඩයක් දීලා ඇහුවා මම කොහේද ඉන්නේ කියලා.ඒ මම ගියාද නැද්ද කියලා තහවුරු කරගන්න.නමුත් මූණමල්දෙණිය උද්ඝෝෂණ ව්‍යාපාරය අවසන් කරලා එතන හිටිය අය මගේ නිවසටත් ඇවිත් කළයුතු දේ කරලා ගිහින් තිබුණා. ජනතා විමුක්ති පෙරමුණේ අය නව ජනාධිපතිතුමාට සහයෝගය දෙන්න එන්නෙත් නෑ, කළයුතු දේ පැහැදිලිව යෝජනා ඉදිරිපත් කරන්නේත් නෑ.රටේ ප්‍රශ්න තිබුණා නමුත් අරගලයේ ප්‍රතිපලය විදියට ජනාධිපතිතුමා එතුමාගේ නිහතමානීත්වය තුළ ඉවත්වුණා.අපි උගත් විදියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිතුමා ඉවත් වුණාම අගමැතිතුමා ජනාධිපති ධූරයට පත්වෙනවා කියන දේ ඇතැම් අයට නොතේරෙන්නේ ඇයි කියලායි මට තිබෙන ගැටලුව.අද අරගලය "රනිල් ගෝ හෝම්" කියලා.ඉතින් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඉවත් වුණොත් දිනේශ් ගුණවර්ධන අගමැතිතුමා ජනාධිපති තනතුරට පත්වෙනවා කියන දේ ඇයි නොතේරෙන්නේ.නැතිනම් ඡන්දයක් තියන්න කියලා කියනවා.දැන් තිබෙන වාතාවරණයත් කඩදාසි හිඟ වීමේ ප්‍රශ්නයත් හා මුදල් කියණ කාරණාවත් මත ඡන්දය මූලික කාරණාව කර නොගෙන රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා බාරගත්ත රට යම්කිසි කාලයක් තුළ දැන් බඩුමිල අඩුවෙලා.ගෑස් මිල අඩුවෙලා.ජනතාවට සහනදායි බවක් ලැබෙමින් තියෙනවා. ඒ නිසා එතුමන්ලාටත් අවස්ථාවක් දීලා පසුව ඡන්දයකට යනවානම් හොඳයි. ප්‍රාදේශීය සභාවේ අපි කියන්නේ ගමේ ජනතාවගේ අදහස්. ජනතා විමුක්ති පෙරමුණේ අයට ජනතාවගේ හිතේ ඉඩක් තිබුණාට ඒ තැන ඔවුන්ම නැතිකරගත් බව ගමේ පසුතලය විපරම් කරලා බැලුවොත් ඔබතුමාලාට පෙනෙයි. නැවත වතාවක් රට යථා තත්වයට ගන්න දරන ප්‍රයත්නයට ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පතනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

සියලු පක්ෂ නියෝජනය කරමින් ඔබතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කළා.එහෙමනම් සුබ පැතීම පමණක් කරලා කෙටියෙන් අදහස් දක්වන්න තවත් අවස්ථාව දෙන්නම්. බොහෝම කෙටියෙන් සුබ පතන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>

ප්‍රථමයෙන්ම මම අභිනවයෙන් පත් වූ ගරු ජනාධිපතිතුමාට සහ අගමැතිතුමාට සුබ පතනවා.එදා ජනාධිපතිවරණය තිබුණ දවසේ ආශ්චර්යයක් සිදුවුණ බව මම සිතනවා. මොකද රනිල් වික්‍රමසිංහ මහතාට පසුගිය වකවානුවේ මහ බැංකු මංකොල්ලකාරයා ආදි බොහෝම දෝෂාරෝපණ එල්ල කළ අයම එතුමාව ජනාධිපති විදියට පත් කළා.ඇත්තටම එය ආශ්චර්යයක්.පසුගිය අවදියේ එතුමා අසාර්ථක වෙන්න ඇති. බොහෝ අසාර්ථක පුද්ගලයෝ තමයි පසුව සාර්ථක වෙන්නේ.අපේ මවු පක්ෂය එක්සත් ජාතික පක්ෂය. ඉතින් හොඳ නායකයෙක් විදියට අපේ රට රැකගනියි කියලා අපි ජනාධිපතිතුමාගෙන්අපේක්ෂා කරනවා.ජයන්ත මන්ත්‍රීතුමා කීවා කොරෝනාවෙන් අපේ රට පසුගිය කාලේ අසාර්ථකතත්වයට පත් වුණා කියලා. අවුරුදු 72ක ඉතිහාසයේ අපේ රට බොහෝම විනාශ වුණේ පහුගිය අවුරුදු දෙක තුළ.අනවබෝධයෙන් කටයුතු කරපු ජනාධිපතිවරයෙක් ඔබතුමාලා පත් කර ගත්තා. අනවබෝධයෙන් රට පාලනය කළ නිසා තමයි මේ රටට මෙහෙම වුණේ.කොරෝනා වසංගතයෙන් පස්සේ බංගලාදේශ වැනි වෙනත් රටවල් නැවත දියුණු වුණා. කොරෝනාවෙන් අපේ රට අසාර්ථකතත්වයට පත් වුණා කියලා කියනවානම් මම ඒකට විරුද්ධයි.ඒ වාගේම ගෝඨාභය රාජපක්ෂ මහතා යුද්ධය කළ හැටිත් මම දන්නවා. මොකද අපේ ගෙදරත් ඉන්නවා යුධ සෙබළෙක්. ගෝඨාභය රාජපක්ෂ මහතා අති බිහිසුණු යුද්ධය වෙලාවෙත් පලා ගියා.මේ වෙලාවේදීත් කළේ ඒකමයි.නමුත් මඟහැර නොයා මේ රටේ ප්‍රශ්නවලට විසඳුම් ගේන්න අවස්ථාව තිබුණා.ඇත්තටම මම සතුටුවෙනවා, මගේ මවු පක්ෂයෙන් ජනාධිපතිවරයෙක් පත්වීම පිළිබඳව. එතුමා අපේ රට සංවර්ධනය කරයි.අනවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති නවත්වලා ග්‍රාමීය ජනතාව ගැන හිතලා එතුමා වැඩ කරයි.එතුමාට සුබ පතනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)</u>

ගරු සභාපතිතුමනි, රනිල් වික්‍රමසිංහ මහතා ආවේ ප්‍රමාදවී නමුත් අනපේක්ෂිතව නෙවෙයි. 69 ලක්ෂයක ජන වරමක් තිබුණු ගෝඨාභය රාජපක්ෂ මහතා සාමකාමී පාලකයෙක් විදියට ධුරය අතහැර පාර්ලිමේන්තුවට බලය දුන්නා නව ජනාධිපතිවරයෙක් පත්කර ගැනීමට.නමුත් මේ රටේ ප්‍රශ්න විසඳන්න කවුරුත් ඉදිරිපත් වුණේ නෑ. නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ප්‍රශ්න විසඳන්න යම්කිසි කාලයක් දීලා එතුමාව පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්ත මත ජනාධිපති ධුරයට පත්වුණා. මේ රටේ ජනතාව පත්වෙලා තිබුණ තත්වයෙන් මුදාගන්න එතුමා ඉදිරිපත් වීමම වටිනවා. අපි එතුමාට සුභ පතනවා වගේම මේ රටේ ජනතාවට සුභ වෙන්න නම් ඔවුන්ගේ ප්‍රශ්න විසඳිය යුතුයි පෙර තිබුණ තැනට රට ගෙනල්ලා.ඉන්ධන ගෙනල්ලා,අත්‍යවශ්‍ය බඩු මිල අඩුවෙලා,රට පෙර තිබුණු තැනටම ගේන්න අවශ්‍යයි.බෙහෙත් මිල අඩු කරලා මේ රටේ ජනතාවට වේල් තුන කාලා ඉන්න පුළුවන් පරිසරයක් ඇති කරන්න ඕනා. ඒකට යම්කිසි කාලයක් අවශ්‍යයි. දේශපාලන සංස්කෘතියට අනුව ඡන්දයකට යාමට නම් මේ රටේ පෝලිම් යුගය අවසන් විය යුතුමයි. QR ක්‍රමයට ජනතාව හුරු නොකර, ගොවියට,වෙළෙන්දාට,රජයේ සේවකයින්ට, සියලුදෙනාටම හොඳින් ජීවත්විය යුතු පරිසරයක් සැදිය යුතුයි.මැතිවරණයකට යනවානම් සියලු වියදම් රුපියල් මිලියන 6.5 ක් වෙනවා.ඒ නිසා මේ මොහොතේ ඒක ලොකු වියදමක්.ඊට පෙර ටික කාලයක් අරගෙන හරි මේ ප්‍රශ්න විසඳලා, ගොවියට,වෙළෙන්දාට, වෘත්තිකයාට සුබ පැත්තක් හදලා රට ගොඩ නඟන්න ඒ ඉල්ලීම කරමින් මම වත්මන් රජයට සුභ පතනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)**</u>

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රමාත්‍යතුමාට මම සුභාශිංෂනය කරනවා. විශේෂයෙන්ම එතුමා තරුණයින්ට පුරාවිද්‍යා අංශයේ රැකියා ලබාදීලා තිබුණා.නමුත් ඒ රැකියා ඔවුනට පොදුජන පෙරමුණ විසින් අහිමි කරලා තියෙනවා.මම ගරු ජනාධිපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔවුනට සහනයක් සලසාදෙන්න කියලා. පවතින ආර්ථික තත්වය හමුවේ ඔවුන් දැඩි අසීරුතාවයට පත්වෙලා ඉන්නේ. නැවතත් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් විදියට ඉල්ලා සිටින අතර රටේ ප්‍රශ්න විසඳීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය එතුමන්ලාට ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**</u>

ගරු සභාපතිතුමනි, මලින්ද ඩයස් මන්ත්‍රීතුමාගේ ගරු ජනාධිපති සහ ගරු අග්‍රමාත්‍යතුමාට සුභ පැතීමේ යෝජනාවට එක්වීමට ලැබීම ගැන සතුටු වෙනවා වගේම ඒ ගැන කතා කරන්න අවස්ථාවක් දීම ගැන ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. මේ රටේ වසර 45කට අධික කාලයක් පාර්ලිමේන්තුවේ අගමැතිධුර හෙබවූ වගේම ඇමතිධුර හෙබවූ අය තමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ දිනේශ් ගුණවර්ධන මැතිතුමා.මේ දෙපළ ජනාධිපති හා අගමැති ලෙස පත්වුණ අතර ඊට පුරෝගාමී වුණේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බව මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරනවා.පක්ෂ ගණනාවක් එකතුවෙලා ඡන්ද 134ක ප්‍රමාණයක් ලබාදීලා තමා මේ පත් කිරීම කරන්නේ. මෙම දෙපළට නැවත වරක් සුභ පතනවා.සුබ පැතීම ප්‍රමාද කිරීම සුදුසු නෑ.අදම සුබ පතන්න ඕනා.ඉදිරියේදී මේ රටේ ජනතාව පත්වෙලා තියෙන ප්‍රශ්නවලින් මුදාගෙන හෙට දවසේ සර්ව පාක්ෂික ආණ්ඩුවේ නව කැබිනට් මණ්ඩලයටත් සුභ පතමින් මේ රටේ මහජනතාවගේ දුක්ගැහැට නිමා කරලා රට ගොඩනගන්න ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. මේ රටේ දේශපාලනය පරිණාමයවෙලා තියෙන්නේ පක්ෂ මත. පසුගිය කාලයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අරියාදු කළා, චෝදනා කළා කියලා කීවා.මේ පටු දේශපාලනය තුළ අඩුවැඩි වශයෙන් එහෙම දේවල් වෙනවා.අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදියටත් මෑත කාලේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදියටත් යම් යම් කාරණා අපි විවේචනය කළා.නමුත් ඔබතුමන්ලා තමයි මුලින්ම පක්ෂය තුලින්ම එතුමාව විවේචනය කරලා සජබ හදාගෙන ඉවත්වෙලා ගියේ.අපි වෙනත් පක්ෂ විදියට එහෙම කළත් ඔබතුමාලා පක්ෂය ඇතුලෙන්මයි එතුමාව විවේචනය කරන්නේ.එහෙම තියාගෙන අපිට ඇඟිල්ල දික් කරන්න එපා කියලා නමුත් රටේ ප්‍රශ්න විසඳන්න සියලුදෙනාම එකතු වෙන්න ඕන කියලා මම මේ වෙලාවේදි මතක් කරනවා.නිශාන්ති මන්ත්‍රීතුමිය හැමදාම ගෝඨාභය රාජපක්ෂ මහතාව පහළට දාලා කථා කරන්නේ.අදත් කීවා යුද්ධය වෙලාවේ පැනලා ගියා කියලා. යුද්ධය වෙලාවේ පැනලා ගියා නෙවේ.ගෝඨාභය රාජපක්ෂ මහතා,සරත් පොන්සේකා මහතා ඇතුළු පිරිස තමා වඩමාරච්චි අවසාන සටන කළේ. ඒ වෙලාවේ ඉන්දියාව බලපෑම් කරනකොට අවසාන සටන කරන්න දුන්නේ නෑ ජේ.ආර්.ජයවර්ධන මහතා ඉන්දියාවට දණින් වැටුණා. යුද්ධය කරන් නැතුව ඉල්ලා අස්කර ගන්නවා. ඒකට කළකිරිලා එතුමා අයින් වෙලා රට ගියා. ඒකයි ඇත්ත.නැතුව යුද්ධය

වෙලාවේ පැනලා ගියා නෙවේ.ඒ වගේම ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රටට විශාල සේවයක් කළා.උපාධිධාරීන් 65,000කට රැකියා දුන්නා.10,000 ක් හිටියා වෙනත් රැකියා කළ අය.අර්ථසාධක මත ඉවත් කළ අය.ඔවුන් උද්ඝෝෂණය කළා.ඔවුන් ළඟට ගිහින් ගෝඨාභය රාජපක්ෂ මහතා පොරොන්දු වුණා ඔවුන්ට රැකියා දෙනවා කියලා.ඒ වෙලාවේ උපාධිධාරීන් කීවා මේ වගේ ළඟට ඇවිත් ඒ ගැන කතා කළ එකම රාජ්‍ය නායකයා එතුමා කියලා. උපාධිධාරී දරුවෝ ප්‍රශංසා කළා එතුමාට.ඒ වගේම ශ්‍රම බලකාය හදන්න හැදුවා 35,000ක් ගත්තා. අවුරුදු 26ක් වැටුප් වර්ධක නැතිව හිටිය ගුරුවරුන්ට ඒක හදලා දුන්නා.ආබාධිත රණවිරුවෝ ගැන හොයලා බැලුවා.වතුකර ජනතාවට රු.650.00යි දෛනික වැටුප.යහපාලන ආණ්ඩුව කාලේ ඒක රු.50.00කින් වැඩි කරලා දෙන්න කියලා ඉල්ලුවා.ඔබතුමාලාට රු.700.00ක් කරලා දෙන්න බැරිවුණාට ඒ වැටුප රු. 1000.00 කරලා දුන්නා.විසඳන්න අමාරු ප්‍රශ්න ගණනාවක් ගෝඨාභය රාජපක්ෂ මහතා විසඳලා දුන්නා. ගෝඨාභය රාජපක්ෂ මහතා කලින් කීවා වගේ ප්‍රජාතන්ත්‍රවාදී වැඩියි. නිහතමානී වැඩියි.ඒ නිහතමානීකම ඇතැමුන් නිවටකමක් ලෙස හිතුවා.සේනාධිනායකයෙක් විදියට එතුමා කටයුතු කළානම් මේ උද්ඝෝෂණය එක දවසින් ඉවරයි.කිසිම කෙනෙකුට කරදර නොකළ එතුමා අයින් වෙලා ගියා.ඊට පස්සේ තමයි මේ දේශපාලන විපර්යාසය සිද්ධ වුනේ.මුළු රටම ගිනිබත් කළා.ගෙවල් 70ක් ඇතුළු රාජ්‍ය දේපල විනාශ කළා.ජනාධිපති මන්දිරයට,අරලියගහ මන්දිරයට, ජනාධිපති කාර්යාලයට, අගමැති කාර්යාලයට හානි කළා. ඒවා ඇතුළට රිංගලා ඒවාගේ පෞරාණික බඩුභාණ්ඩ විනාශ කළා.මේ අහිංසක විරෝධතාකරුවෝද?මේක ත්‍රස්තවාදයක්.මේකට නායකත්වය දෙන්නේ කුමාර් ගුණරත්නම්ලා,ජෝෂප් ස්ටාලිං ලා,රවී කුමුදේශ්ලා.මේ රට අපි හිතන තැනකට නෙවෙයි ගමන් කරන්නේ.රනිල් වික්‍රමසිංහ මහතාට පිං සිද්දවෙන්න මේක මැඩ පැවැත්තුවා. ගෝඨාභය රාජපක්ෂ මහතාට මේක කරන්න තිබුණා. නමුත් එතුමා බලය පාවිච්චි කළේ නෑ.ඒ නිසා තමයි එතුමාට යන්න සිදුවුණේ. පසුගිය මාස 2-3 ඇතුළත විශාල බල පෙරළියක් රට තුළ සිදුවුණා. ගෝඨාභය රාජපක්ෂ මහතා 2019 වර්ෂයේ නොවැම්බර් 16වැනිදා පත්වෙනවා.නමුත් 2020 මාර්තු 20වැනිදා පළවෙනි වතාවට රට තුළ සංචරණ සීමා පනවනවා. අවුරුදු 2ක් තිස්සේ කොරෝනා අර්බුදය ඇවිත් ඒ වසංගතය මේ රට තුළ ක්‍රියාත්මක වෙනවා. කොරෝනා අර්බුදය නිසා මේ රටේ ආර්ථික අර්බුදයක් ඇති වුණා.ඒ හරහා දේශපාලන අර්බුදයක් ඇති වුණා.පසුගිය අවුරුදු දෙකේ අපි හොඳින් හිටියා. මම නම් පිං දෙනවා.නැතිනම් දවසට තුන්හාරසීයයක් මැරුණා.ඩොලර් බිලියන 5ක එන්නත් ගෙනාවා මේ වසංගතය නවත්වන්න.අපිට ඩොලර් ලැබුණේ සංචාරක ක්ෂේත්‍රයෙන්.සංචාරකයෝ ලක්ෂ 20ක් වර්ෂයකට මේ රටට ආවා.එයින් අපට ලැබුණා ඩොලර් බිලියන 4.5ක්.එය අපිට අහිමි වුණේ මේ කොවිඩ් නිසා.විදේශ ප්‍රේෂණ මාසයකට ඩොලර් බිලියන 750ක් උපරිම 751ක් ලැබිලා තියෙනවා. දැන් ලැබෙන්නේ මාසයකට ඩොලර් බිලියන 251ක් වගේ ප්‍රමාණයක්. මාසයකට ඩොලර් බිලියන500ක් අඩුයි විදේශ ප්‍රේෂණවල. මේවා අහිමි වුණේ මේ කොවිඩ් නිසා.නමුත් මතයක් හැදුවා ගෝඨාභය රාජපක්ෂ මහතා, මහින්ද රාජපක්ෂ මහතා හොරකම් කළා කියලා.නමුත් බොරුව කවදාවත් ජය ගන්නේ නෑ. ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රට බාර ගන්නකොට සෑම රජයක්ම වර්ෂයකට ආනයනය කරන භාණ්ඩවලට ඩොලර් බිලියන 30ක් වියදම් කළා.වාහන ගෙන ඒම නැවැත්වීම මත එය ඩොලර් බිලියන 21 දක්වා පහළ වැටුණා.ඩොලර් බිලියන 8ක් අඩු වුණා.ඒවා රටට නිසි පරිදි ලැබෙනකොට තමා භාණ්ඩ ආනයනය කළේ.ඒ සියල්ල මේ කොවිඩ් නිසා නැති වුණා. කවුරු රට ගත්තත් සංචාරක ව්‍යාපාරය හා විදේශ ප්‍රේෂණ ටික නැවත යථා තත්වයට පත්වෙන්න ඕනා. ඩොලර් ලැබෙන ක්‍රම 5යි තියෙන්නේ. සංචාරක ව්‍යාපාරය, විදේශ ප්‍රේෂණ,අපනයන කර්මාන්තය,විදේශ ආයෝජන,විදේශ ණය ලබා ගැනීම හෝ ප්‍රතිව්‍යුහ ගත කිරීම මඟින් තමා ඩොලර් ලැබෙන්නේ අපට.එයින් ප්‍රධාන ක්‍රම දෙක තමා කඩා වැටුණේ.භාණ්ඩාගාරයේ ඩොලර් බිලියන 7.5ක් තිබුණා. ඒකෙන් ඩොලර් බිලියන 5ක් වියදම් කරලා තමයි කොවිඩ් කළමණාකරණය කළේ. මෙයයි ඇත්ත තත්වය.මඩ ගැසීම් නොකර මේ සංඛ්‍යා ලේඛන එක්ක දරුවන්ට කියලා දෙන්න. ගරු ජනාධිපති සහ ගරු අග්‍රමාත්‍යතුමාට මෙන්ම හෙට බිහිවෙන සර්ව පාක්ෂික ආණ්ඩුවෙන් ජනතාවට සහන සලසලා යහපත් තත්වයක් රට තුළ ඇති කරන්න හැකිවේවායි සුබ පතනවා.

<u>ගරු සභාපති බී.එම්. ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මලින්ද ඩයස් මහතා යෝජනාවක් ඉදිරිපත් කළා ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පැතීම සුදුසුයි කියලා. මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක්. මේ රටේ පාර්ලිමේන්තු සම්ප්‍රදායක් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තියෙනවා.

ගෝඨාභය රාජපක්ෂ මහතා හා මහින්ද රාජපක්ෂ මහතා තනතුරුවලින් ඉවත්වීමත් සමඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයෙක් හා අගමැතිවරයෙක් පත්විය යුතුයි. ඒ අනුව රනිල් වික්‍රමසිංහ ගරු ජනාධිපතිතුමාත් දිනේශ් ගුණවර්ධන අග්‍රමාත්‍යතුමාත් පත්වුණා. ඊට කාටවත් විරුද්ධ වෙන්න බෑ. ආණ්ඩුවක් වෙනස්වෙන ක්‍රමයක් තියෙනවා. මහ මැතිවරණයකින් ජනතාවට පුළුවන් එය වෙනස් කරන්න.අරගලකරුවන්ගේ ඉල්ලීම වුණේ සර්වපාක්ෂික ආණ්ඩුවක් හදන්න කියන එක. දැන් එය ඉටුවෙලා තියෙන්නේ. රනිල් වික්‍රමසිංහ ගරු ජනාධිපතිතුමාත් කීවා මේ රට ගොඩනගන්න සියලු පක්ෂ එකතුවෙන්න කියලා. සමහර පක්ෂ කැමති නෑ. ඒ ඔවුන්ගේ මතය. රනිල් වික්‍රමසිංහ මහතාට මම ගරු කරනවා. මොකද මේ රට අරාජික වූ මොහොතේ ඒ අභියෝගය බාරගත්තේ එතුමා.අවසානේ එතුමාගේ නිවසත් අහිමි වුණා.විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න කියනවා දැන්. විධායක ජනාධිපති බලය පාවිච්චි නොකළ අය අතර කෙනෙක් තමා ගෝඨාභය රාජපක්ෂ මහතා.ජේ.ආර්.ජනාධිපතිතුමා විධායක බලය දීලා කීවේ මට ගැහැණියක් පිරිමියෙක් කරන්නයි පිරිමියෙක් ගැහැණියක් කරන්නයි විතරයි කියලා. ප්‍රජාතන්ත්‍රවාදයට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ දිනේශ් ගුණවර්ධන මැතිතුමා මේ රට බාර ගත්තා. ඊට පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ එක මන්ත්‍රීවරයෙක් හැර අනිත් සියලුම මන්ත්‍රීවරු සුබ පැතුවා.ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට පඹුවස්නුවර ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හැටියට සුභාශිංෂන එකතු කළා. ඒ වගේම අපි අනවබෝධයෙන් නෙවෙයි ඡන්දය දුන්නේ.හැට නව ලක්ෂයක් ඡන්දය දුන්නේ අවබෝධයෙන්.කොවිඩ් ව්‍යසනය මේ රටේ ආර්ථිකයට ලොකු විනාශයක් කළා.යුරෝපයෙන් කීවේ ලංකාව තමා කොවිඩ් පාලනය කිරීම අතරින් ඉහළින්ම ඉන්න රට කියලා.ඒ රටේ තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා හිටියේ කියලා අමතක වුණා.යුද්දේ ආලා ගියේ නෑ. 30 අවුරුදු යුද්ධය අවසන් කළේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා.ඉතින් මෙතුමාලා කළ වරද කොවිඩ් වසංගතයයි යුද්ධයයි අවසන් කළ එකද? මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා කීවා ITN නාලිකාව අල්ල ගත්ත වෙලාවේ ඒක බාර ගන්න නායකයෙක් නෑ. ඒ වගේම අරගලය බාර ගන්න නායකයෙක් නෑ.අපිටත් ප්‍රශ්නයක් ඒක.ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන මහජන නියෝජිතයෝ විදියට අපි ගරු ජනාධිපතිතුමාටත් ගරු අග්‍රමාත්‍යතුමාටත් සුභාශිංෂන එකතු කරනවා පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව විදියට ප්‍රජාතන්ත්‍රවාදීව මැතිවරණයක් පැවැත්වීමට හැකි පරිදි මේ රට නැවත තිබුණු තත්වයට ගෙන ඒමට ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ඒ අනුව ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමාට සුබ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව සහා සම්මත කරන ලදී.**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා ප.ව.12.45 ට පමණ ගරු සභාවට පැමිණියා.

## 06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

## 2022.07.14දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා, පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.07.14දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙය- (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022.07.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022.07.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමනි,MG330මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අලුත්වැඩියාව වෙනුවෙන් රු. 1,107,350.00ක මුදලක් ජානක ඉන්ජිනියර්ස්, තෝරගල්ල,පඩුවස්නුවර වෙත ගෙවීම සුදුසු බව තීරණය කර තිබුණත් සභාව අනුමත කර තිබුණු මුදල හාර ලක්ෂ ගණනක බැවින් මම මෙම මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාවේ MG330මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අලුත්වැඩියාවට අදාළ කාරණාවට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමනි, එම වාර්තාවේ MG330මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අලුත්වැඩියාවට අදාළ කාරණාවට මමත් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.ඒ වගේම එය සනාථ කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.07.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.07.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ සභා සම්මත විය.**

07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

**I. 2022 ජූලි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**
**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

උපලේඛන 01

ප්‍රා.ස-14

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2543646.04 | 1396761.22 | 1378063.09 | 42440.00 | 144088.65 | 2858799.18 | 8363798.18 |
| 2 | ගමන් වියදම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 316035.00 | 321971.60 | 393000.00 | 0.00 | 0.00 | 0.00 | 1031006.60 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 109406.00 | 96805.00 | 1331275.00 | 0.00 | 0.00 | 22275.00 | 1559761.00 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 110995.94 | 25172.92 | 0.00 | 61889.30 | 62347.65 | 23810.15 | 284215.96 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 28820.43 | 52213.46 | 0.00 | 0.00 | 0.00 | 13053.36 | 94087.25 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **3108903.41** | **1892924.20** | **3102338.09** | **104329.30** | **206436.30** | **2917937.69** | **11332868.99** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 1710.00 | 1710.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **1710.00** | **1710.00** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **3108903.41** | **1892924.20** | **3102338.09** | **104329.30** | **206436.30** | **2919647.69** | **11334578.99** |
| | තැන්පත් | 178405.27 | | | | | | 178405.27 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 38767.00 | | | | | | 38767.00 |
| | සේවක ණය | 131952.00 | | | | | | 131952.00 |
| | අත්තිකාරම් | 32500.00 | | | | | | 32500.00 |
| | ණයහිමි | 0.00 | | | | | | 0.00 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **381624.27** | | | | | | **11716203.26** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජුලි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 ජුලි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම් පයිසර් මහතා - (ශ්‍රී ල.මු.කො.)</u>**

2022 ජුලි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජුලි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජුලි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2022 ජුලි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 1884.00 | 12400.00 | | | | 87000.00 | 101284.00 |
| 20 කුලී | | | 653795.00 | | 1202742.00 | 0.00 | 1856537.00 |
| 30 බලපත්‍ර ගාස්තු | | 63750.00 | | | | 3600.00 | 67350.00 |
| 40 සේවා සදහා ගාස්තු | | 261750.00 | 121659.50 | 74711.86 | | 44010.00 | 502131.36 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | | | 18220.00 | | 22637.10 | 410.00 | 41267.10 |
| 60 වෙනත් ආදායම් | 32106.33 | 17900.00 | | 339841.00 | | 59058.00 | 448905.33 |
| 70වෙනත් ආධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **33990.33** | **355800.00** | **793674.50** | **414552.86** | **1225379.10** | **194078.00** | **3017474.79** |
| ප්‍රාග්ධන ආධාර | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **33990.33** | **355800.00** | **793674.50** | **414552.86** | **1225379.10** | **194078.00** | **3017474.79** |
| තැන්පත් | 128900.00 | | | | | | 128900.00 |
| වැට් | | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | | | | | | | 0.00 |
| මුද්දර බදු | 25880.00 | | | | | | 25880.00 |
| සේවක ණය | 466446.50 | | | | | | 466446.50 |
| අත්තිකාරම් | 22500.00 | | | | | | 22500.00 |
| ණය ගැති | 5215.00 | | | | | | 5215.00 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | | | | | | | 0.00 |
| අගරු චෙක් | | | | | | | 0.00 |
| මුදල් මාරු | | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 15300.00 | | | | | | 15300.00 |
| **මුළු එකතුව** | **664241.50** | | | | | | **3681716.29** |

**උපලේඛන 02**

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022 ජුලි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**
2022 ජුලි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම් පයිසර් මහතා - (ශ්‍රී ල.මු.කො.)</u>**
2022 ජුලි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022 ජුලි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022ජුලි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. 2022 ජුලි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.**

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය | මාසය මුලදී ඉදිරියට ලැබීම් | මාසය තුළ බිල් කිරීම් | ලැබිය යුතු මුළු ආදායම | මාසය තුළ ලද ආදායම | මාසයට අදාල කලින් ලැබූ ආදායම | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය | ඉදිරියට ගෙන යන හිඟය | ඉදිරියට ලැබීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| | | | | | (1+3) | | | ( 2-6) | | | 4 - (5+6) | (7+8) |
| 1 | වරිපනම් බදු 1/11 | 294644.72 | 633615.95 | 0.00 | 0.00 | 1264.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු 1/12 | 29371.84 | 5034.50 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | කඩ කුලී 3/22 | 309060.00 | 60367.34 | 756250.00 | 1065310.00 | 655795.00 | 40077.34 | 20290.00 | 21162.34 | 5000.00 | 390600.00 | 41452.34 |
| 4 | වත්කම් බදු 5/23 | 1306347.00 | 21850.00 | 994666.00 | 2301013.00 | 797502.00 | 11650.00 | 10200.00 | 0.00 | 0.00 | 1491861.00 | 10200.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 764912.16 | 50065.57 | 485030.00 | 1249942.23 | 339841.00 | 12422.34 | 37643.15 | 20466.13 | 215.00 | 917929.95 | 58384.28 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 11400.00 | 11400.00 | 11400.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 1000.00 | 1000.00 | 1000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 63750.00 | 63750.00 | 63750.00 | 63750.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු 2/34 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | එකතුව | 2704335.72 | 770933.36 | 2312096.00 | 4692415.23 | 1870552.00 | 127899.68 | 68133.15 | 41628.47 | 5215.00 | 2800390.95 | 110036.62 |

**උපලේඛන 03**

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 ජුලි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

2022 ජුලි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම් පයිසර් මහතා - (ශ්‍රී ල.මු.කො.)**

2022 ජුලි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 ජුලි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජුලි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. 2022 සැප්තැම්බර් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව.

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 04

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථන | | | අය වී ඇති ආදායම 2022 ජුලි | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 440500 | 150000 | 590500 | 1007027.98 | 1264 | 1008291.98 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 13000 | 2200 | 15200 | 3588 | 620 | 4208 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 250 | 50 | 300 | 13500 | 0 | 13500 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 0 | 0 | 0 | 26500 | 1000 | 27500 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 0 | 0 | 0 | 1033200 | 11400 | 1044600 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 15000 | 5000 | 20000 | 627383.15 | 63750 | 691133.15 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 125000 | 0 | 125000 | 0 | 0 | 0 | 66000 | 0 | 66000 |
| කඩ කුලී ( 3/22 ) | 8350800 | 0 | 8350800 | 2087700 | 695900 | 2783600 | 4373009.81 | 655795 | 5028804.81 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 297000 | 0 | 297000 | 0 | 0 | 0 | 262200 | 0 | 262200 |
| රථගාල් ගාස්තු(3/43/3) | 300000 | 0 | 300000 | 90000 | 20000 | 110000 | 85200 | 42000 | 127200 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 1449000 | 484000 | 1933000 | 2920472.95 | 340056 | 3260528.95 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 1710000 | 821450 | 2531450 | 3761970 | 405240 | 4167210 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 2464360 | 821455 | 3285815 | 12173500 | 797502 | 12971002 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 110000 | 35000 | 145000 | 393705 | 87000 | 480705 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 45000 | 15000 | 60000 | 1000 | 0 | 1000 |
| එකතුව | 38889943 | 0 | 38889943 | 8424810 | 3050055 | 11474865 | 54442795.2 | 2405627 | 56848422.2 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 සැප්තැම්බර් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 සැප්තැම්බර් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම් පයිසර් මහතා - (ශ්‍රී ල.මු.කො.)</u>**

2022 සැප්තැම්බර් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 සැප්තැම්බර් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 සැප්තැම්බර් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V. 2022 අගෝස්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 05

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ඌන තාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | | 93270132.00 | 54407577.00 | 7772511.00 | 62180088.00 | 24379330.19 | 8363798.18 | 32743128.37 | 29436959.63 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | | 1064000.00 | 550000.00 | 75000.00 | 625000.00 | 97330.00 | 0.00 | 97330.00 | 527670.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 12263000.00 | 2000.00 | 12265000.00 | 5338000.00 | 1000000.00 | 6338000.00 | 5659294.70 | 1031006.60 | 6690301.30 | -352301.30 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | | 14040000.00 | 10300000.00 | 920000.00 | 11220000.00 | 3636703.23 | 15597.61 | 3652300.84 | 7567699.16 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | | 11474000.00 | 6901000.00 | 873000.00 | 7774000.00 | 2938416.60 | 284215.96 | 3222632.56 | 4551367.44 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | 67402.40 | 15000.00 | 82402.40 | 74789.55 | 0.00 | 74789.55 | 7612.85 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | | 6138000.00 | 3138000.00 | 650000.00 | 3788000.00 | 491095.00 | 0.00 | 491095.00 | 3296905.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 968040.00 | 528000.00 | 80000.00 | 608000.00 | 167585.12 | 94087.25 | 261672.37 | 346327.63 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | 21130000.00 | 2995000.00 | 24125000.00 | 1415732.49 | 1710.00 | 1417442.49 | 22707557.51 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | 704858.83 | 300000.00 | 1004858.83 | 261347.00 | 0.00 | 250000.00 | 754858.83 |
| | එකතුව | 176005532.00 | | 176005532.00 | 103064838.23 | 14680511.00 | 117745349.23 | 39121623.88 | 9790415.60 | 48912039.48 | 68833309.75 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අගෝස්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 අගෝස්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම් පයිසර් මහතා - (ශ්‍රී ල.මු.කො.)</u>**

2022 අගෝස්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අගෝස්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 අගෝස්තු මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් ,2022 වර්ෂයේ අගෝස්තු මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ප.ව.12.55 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කළේ -ඩබ්.එම්.එන්.ප්‍රියදර්ශනී, සංවර්ධන නිලධාරී.

වාර්තා කළේ -එච්.ඒ. ජී.නිශ්ශංක, ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.